// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,115 - 2019 මාර්තු මස 15 වැනි සිකුරාදා - 2019.03.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 436 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 437 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | 438 |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 454 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


***සැ. යු.*** - (i) පොල් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත 2019 පෙබරවාරි මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත 2019 පෙබරවාරි මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 අප්‍රේල් මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 මාර්තු මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

435 – B 081504 — 403 (2019/03)
A 1-

# වෙනත් පත්කිරීම් ආදිය

2019 අංක 143

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

### යුද්ධ හමුදාධිපති විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම්

1. පහත නම සඳහන් නිලධාරීන් 2019 පෙබරවාරි මස 15 වැනි දින සිට තාවකාලික කපිතන් (උපකරණ පාලක) නිලයට උසස් කිරීම අනුමත කරමි.

අ. ලුතිනන් (උපකරණ පාලක) බස්නායක මුදියන්සේලාගේ සිරිපාල ගැහේබ (නි/69377)

ආ. ලුතිනන් (උපකරණ පාලක) මාතොටගේ අරුණ නිශාන්ත ශ්‍රීලයුපොහේබ (නි/69380)

ඇ. ලුතිනන් (උපකරණ පාලක) මද්දුම හේවාගේ උපුල් නන්දන ශ්‍රීලංඉබ (නි/69381)

ඈ. ලුතිනන් (උපකරණ පාලක) බස්නායක මුදියන්සේලාගේ රංජිත් ප්‍රියන්ත බස්නායක ශ්‍රීලයුපොදුසේබ (නි/69383)

ඉ. ලුතිනන් (උපකරණ පාලක) තෙන්නකෝන් මුදියන්සේලාගේ අනුරුද්ධ තෙන්නකෝන් ශ්‍රීලයුවෙබ (නි/69384)

ඊ. ලුතිනන් (උපකරණ පාලක) පත්තිනිය දූරගේ සුජිත් නිරෝෂන් ශ්‍රීලකාහ (නි/69385)

උ. ලුතිනන් (උපකරණ පාලක) වර්ෂමාන දේවයලාගේ සමන් සිසිර කුමාර විබ (නි/69386)

ඌ. ලුතිනන් (උපකරණ පාලක) වීසිරි මුදියන්සේලාගේ සමන්ත කුමාර ශ්‍රිලසසබ (නි/69387)

එ. ලුතිනන් (උපකරණ පාලක) තැබැරුම් ගෙදර කරුණාරත්න උදය ජයලත් ඉසේබ (නි/69389)

ඒ. ලුතිනන් (උපකරණ පාලක) හේරත් මුදියන්සේලාගේ අනුර රුවන් බණ්ඩාර හේරත් ගරෙ (නි/69390)

ඔ. ලුතිනන් (උපකරණ පාලක) දෙනිපිටියගෙ දොන් සමන්ත තුෂාර දෙනිපිටිය ශ්‍රීලකාහ (නි/69395)

ඕ. ලුතිනන් (උපකරණ පාලක) මාරසිංහ ආරච්චිලාගේ රුවන් දිලීප මාරසිංහ සබුබ (නි/69396)

ක. ලුතිනන් (උපකරණ පාලක) හල්ලොළුව කංකානම්ගේ ශාන්ත පුෂ්ප කුමාර විබ (නි/69397)

ග. ලුතිනන් (උපකරණ පාලක) දොඩම්ගොඩගේ දොන් ප්‍රදීප් කුමාර ශ්‍රීලංසිරෙ (නි/69398)

ජ. ලුතිනන් (උපකරණ පාලක) කංකානම්ගේ මර්වින් ආනන්ද ශ්‍රීලයුවෙබ (නි/69399)

ට. ලුතිනන් (උපකරණ පාලක) පල්ලෙවත්තේ අවල යෙහෙන් ප්‍රසන්න ගැහේබ (නි/69403)

ඩ. ලුතිනන් (උපකරණ පාලක) දියලගොඩ පතිරන්නැහේලාගේ ප්‍රේමලාල් සෝමතිලක ශ්‍රීලයුපොදුසේබ (නි/69405)

ණ. ලුතිනන් (උපකරණ පාලක) වීරසේකර මුදියන්සේලාගේ සුසන්ත ප්‍රියදර්ශන වීරසේකර ශ්‍රීලයුසේබ (නි/69406)

ත. ලුතිනන් (උපකරණ පාලක) බාලසූරිය මුදියන්සේලාගේ උපුල් චන්දන බාලසූරිය ශ්‍රීලපාහ (නි/69407)

ද. ලුතිනන් (උපකරණ පාලක) බොරළුවේ විදානලාගේ බොනිල් ජයකුමාර ඉසේබ (නි/69408)

න. ලුතිනන් (උපකරණ පාලක) වීරසිංහ මුදියන්සේලාගේ රිටිගහවත්තේ ගෙදර සමන්ත වීරසිංහ යූඑස්පී ගැහේබ (නි/69409)

ප. ලුතිනන් (උපකරණ පාලක) එගොඩවත්ත රාලලාගේ කරුණාතිලක බංඩාර ශ්‍රීලපාහ (නි/69411)

බ. ලුතිනන් (උපකරණ පාලක) බංඩාගේ තිලකරත්න යූඑස්පී ශ්‍රීලංසිරෙ (නි/69416)

එන් යූ එම් එම් ඩබ්ලිව් සේනානායක,
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී යූඑස්ඒසීජීඑස්සී,
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

2018 දෙසැම්බර් මස 21 වැනි දින,
යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ.

03 - 607

---

2019 අංක 144

## වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය

පී. එච්. සී. එන්. පන්කඳුරුගම මහත්මිය 2018.11.19 වැනි දින සිට 2018.12.20 දක්වා වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ නීති නිලධාරි ලෙසත්,

පී. එච්. සී. එන්. පන්කඳුරුගම මහත්මිය 2018.12.21 වැනි දින සිට නැවත දැනුම් දෙනතුරු වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ නීති නිලධාරි ලෙසත් පත් කරමි.

පරාක්‍රම දිසානායක,
ලේකම්,
වරාය හා නාවික කටයුතු,
දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය.

03 - 882

# රජයේ නිවේදන

## 1941 අංක 39 දරන ණයසහනදායක ආඥාපනත

### අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම්දීම

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත 1941 අංක 39 දරන ණයසහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකය ඉදිරියේ දක්වා ඇති ණයකරු ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණය තුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ ණයහිමියන් වෙත ආඥාපනතේ 25 (1) 26 (1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

රෝෂණී හෙට්ටිගේ,
ලේකම් (වැ.බ),
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2019 පෙබරවාරි මස 28 වැනි දින,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව,
අංක 35 ඒ,
ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත,
කොළඹ 08.

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමියාගේ නම සහ ලිපිනය* | *මීළඟ කැඳවීම් දිනය* |
|---|---|---|---|
| (01) 44926 | රුවන්ගල ගෙදර විජේනන්ද මයා, අංක 551, වැවතැන්න, අම්පිටිය. | සුන්දරරාජ් දිනේසන් මයා, අංක 313/2, වැවතැන්න. අම්පිටිය. | 2019.03.27 |
| (02) 42655 | හල්ලොලුව කංකානම්ගේ දර්ශනප්‍රිය සුභාෂණ ජයසේකර මයා, ජයසෙවන, ගොඩකකන්ද, උළුවිටිකේ, ගාල්ල. | බෙන්තොට පතිරණගේ පියකමල් සෙනරත් මයා, උඩුමුල්ලවත්ත, ලබුදූව, ගාල්ල. | 2019.04.24 |
| (03) 40855 | එදිරිසිංහගේ සුජාතා පද්මිණී මිය, අංක 62, කිරියන්කල්ලිය, මුන්දලම. | ජයලත් පතිරණලාගේ සුමිත් වීරකෝන් මයා, අංක 43, රත්කුඹුර, හොරම්පැල්ල. | 2019.04.23 |
| (04) 44844 | වික්‍රමගේ සමන්තිනී මිය, අංක 38/19, කඹුරුගොඩ, බණ්ඩාරගම. | වික්‍රමතන්ත්‍රිගේ ඩිස්නි ශිරන්ත මයා, අංක 30/85, පානදුර පාර, බණ්ඩාරගම. | 2019.04.29 |
| (05) 44950 | අබේකෝන් ජයසුන්දර මුදියන්සේලාගේ ප්‍රියංගා මිය, අංක 181/1, තලාහේන, මාලබේ. | කට්ටාඩි දේවගේ ක්‍රිෂාන් සංජුල ප්‍රියංගන මයා, අංක 195/5, තලාහේන, මාලබේ. | 2019.04.26 |
| (06) 44807 | සේනානායක ගනෙහි මුදියන්සේලාගේ සමන්තිලක සේනානායක බංඩාර මයා, අංක ජී/50/1, සිරි නිවස, කහගල්ල, දේවාලේගම. | අතපත්තු ගම්ලත් රාළලාගේ ජයරත්න අතපත්තු මයා, කහගල්ල, දේවාලේගම. | 2019.05.09 |
| (07) 44957 | වික්‍රමගේ දොන් දූලියෙස් වික්‍රමසිංහ මයා, අංක 18/A1, "විමුක්ති", කුඩාමාදූව පාර, සංඝාරාම, සිද්ධමුල්ල, පිළියන්දල. | විජේසිංහ ආරච්චිගේ තුෂාර සංජීව විජේසිංහ මයා, අංක 446/1, වැවල හන්දිය, ගාලු පාර, හික්කඩුව. | 2019.05.03 |

| ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමියාගේ නම සහ ලිපිනය | මීළඟ කැඳවීම් දිනය |
|---|---|---|---|
| (08) 44912 | මෙරගල් පේඩිගේ පද්මිණී චන්ද්‍රලතා මිය, අංක 233, කටුවස්ගොඩ, වේයන්ගොඩ. | මෙරගල් පේඩිගේ ශ්‍යාමලී දිල්හානි මිය, අංක 234/1, කටුවස්ගොඩ, වේයන්ගොඩ. | 2019.05.20 |

03 - 1115

---

## ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

### එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම

2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන

**ස්වාධීන විගණන වාර්තාව**

**එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමෙහි කළමණාකාරිත්ව කමිටුව වෙත**

*මූල්‍ය ප්‍රකාශන මත වාර්තාව :*

එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනමෙහි (පදනම) 2017 දෙසැම්බර් මස 31 වැනි දිනට ආදායම් සහ වියදම් ප්‍රකාශ සහ දිනට අවසන් වූ වර්ෂයෙහි අරමුදල් හා මුදල් ප්‍රවාහ වෙනස්වීම සහ සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සංග්‍රහයක් සහ අනෙකුත් තොරතුරු පැහැදිලි කිරීම්වලින් සමන්විත ප්‍රකාශ අප විසින් විගණනය කර ඇත.

*මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරිත්වයේ වගකීම :*

කුඩා සහ මධ්‍ය පරිමාණ අස්තිත්වයන්ට අදාළවන (SME සඳහා SLFRS). ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ සාධාරණ අයුරින් ඉදිරිපත් කිරීම කළමණාකාරිත්ව කමිටුවේ ("කමිටුව") වගකීමය. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශවලින් නිදහස් වීම සඳහා අභ්‍යන්තර පාලන නිර්මාණය කිරීම සහ පවත්වා ගැනීමත් මෙම වගකීමට ඇතුළත්ය.

*විගණකවරයාගේ වගකීම :*

අපගේ වගකීම වනුයේ අපගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන මත මතයක් ප්‍රකාශ කිරීමය. අපි අපගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව ක්‍රියාත්මක කළෙමු. අප විසින් ආචාරධර්ම අවශ්‍යතා පිළිපදිනු ලැබීම සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශවලින් නිදහස් වන්නේ ද යන්න පිළිබඳ හේතු සහගත තහවුරුවක් ලබා ගැනීම සඳහා විගණනය සැළසුම් කිරීමත්, ක්‍රියාත්මක කිරීමත් එකී ප්‍රමිතවලින් අවශ්‍ය කෙරෙයි.

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණයන් සහ හෙළිදරව් කිරීම් පිළිබඳ විගණන සාක්ෂි ලබා ගැනීමට විගණක ක්‍රියා පටිපාටි අනුගමනය කිරීම විගණනයකට ඇතුළත් ය. තෝරාගනු ලබන පටිපාටි, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශවල අවදානම තක්සේරු කිරීම ද ඇතුළත්ව විගණකවරයාගේ නිගමනය මත රඳා පවතී. එකී අවදානම් විගණකවරයා අදාළ වාතාවරණය යටතේ උචිත විගණන ක්‍රියා පටිපාටි නිර්මාණය කිරීම සඳහා අස්තිත්වයෙහි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමටත් සාධාරණ ඉදිරිපත් කිරීමටත් සම්බන්ධ අභ්‍යන්තර පාලක සැලකිල්ලට ගන්නා නමුත් ඒ අස්තිත්වයෙහි අභ්‍යන්තර පාලකවල ඵලදායීතාවය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ පරමාර්ථය අරමුණු නොකරයි. භාවිත කළ ගිණුම් ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ කමිටුව විසින් සකස් කරන ලද ගිණුම්කරණ ලද ඇස්තමේන්තුවල සහේතුකභාවය ඇගයීමත් එසේම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සමස්ථයක් වශයෙන් ඇගයීමත් විගණනයකට ඇතුළත් ය.

*මතය :*

අපගේ මතය වනුයේ මූල්‍ය ප්‍රකාශ මගින් 2017 දෙසැම්බර් මස 31 වැනි දිනට පදනමෙහි මූල්‍ය තත්ත්වය සහ එදිනට අවසන් වූ කාලපරිච්ඡේදයෙහි දී එහි මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිමයන් සඳහා (SME සඳහා SLFRS) වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරන බව ය.

වරලත් ගණකාධිවරු.
කොළඹ.

2019 පෙබරවාරි මස 10 වැනි දින.

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් මස 31 වැනි දිනට. | සටහන් | *2017* රු. | *2016* රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| *ජංගම නොවන වත්කම්* | | | |
| දේපළ පිරියත සහ උපකරණ (නිදහස්) | 2.1 | 967,962.190 | 1,007,351,800 |
| දේපළ පිරියත සහ උපකරණ (CHOGM) | 2.2 | 21,570,887 | 33,570,187 |
| කුළී වත්කම් | 2.3 | 6,127,495 | 12,577,495 |
| කෙරීගෙන යන වැඩ | | 4,310.510 | 436,406 |
| අස්පෘශ්‍ය වත්කම | 3 | 1,371,769 | 2,580,510 |
| ජංගම නොවන මූල්‍ය වත්කම් | 4 | 41,029,141 | 31,569,796 |
| **ජංගම නොවන වත්කම් එකතුව** | | **1,042,371,992** | **1,088,086,194** |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 5 | 12,631.842 | 10,077,645 |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 6 | 148,643,403 | 102,718,021 |
| කෙටිකාලීන ආයෝජන | 7 | 1,248,511,759 | 403,079,123 |
| තැන්පතු, කලින් ගෙවීම් සහ අත්තිකාරම් | 8 | 24,146,107 | 11,887,514 |
| මුදල සහ මුදල් සමාන දෑ | 9 | 105,332,563 | 433,420,846 |
| | | **1,539,265,674** | **961,183,149** |
| වත්කම් එකතුව | | **2,581,637,666** | **2,049,269,343** |
| **අරමුදල් සහ වගකීම්** | | | |
| **අරමුදල්** | | | |
| ප්‍රාග්ධන සංචිතය | | 925,522 | 925,522 |
| ප්‍රාග්ධන ආධාර අරමුදල | 10 | 364,622,370 | 375,200,167 |
| CHOGM 2013 අරමුදල | 10 | 21,570,887 | 33,570,187 |
| එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක සමුච්චිත අරමුදල | | 1,858,880,440 | 1,365,474,130 |
| | | **2,245,999,219** | **1,775,170,006** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| මූල්‍ය කල්බදු වගකීම් | 11.2 | 5,883,497 | 10,887,660, |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම | 12 | 61,120,757 | 51,253,741 |
| | | **67,004,254** | **62,131,401** |
| **ජංගම වගකීම්** | | | |
| වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | 13 | 153,677,250 | 132,456,553 |

| දෙසැම්බර් මස 31 දිනට. | සටහන් | *2017* *රු.* | *2016* *රු.* |
|---|---|---|---|
| උපචිත වියදම් | 14 | 110,463,111 | 75,017,551 |
| මුල්‍ය කල්බදු වගකීම් | 11.1 | 4,493,832 | 4,493,832 |
| | | **268,634,193** | **211,967,936** |
| **වගකීම් එකතුව** | | 335,638,447 | 274,099,337 |
| **අරමුදල් සහ වගකීම් එකතුව** | | **2,581,637,666** | **2,049,269,343** |

මුල්‍ය ප්‍රකාශන කියවිය යුත්තේ පදනමෙහි මෙම මුල්‍ය ප්‍රකාශනවල සංගතික කොටසක් වන අදාළ සටහන් සමග එක්ව ගෙනය. මුල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාන අස්තීත්වයන් සඳහා වන ශ්‍රී ලංකා මුල්‍ය වාර්තාකරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙළ කර ඇති බව සහතික කරමි.

..................................................... ...........................................................

මුදල් කළමනාකරු. ප්‍රධාන විධායක නිලධාරි/අධ්‍යක්ෂ.

කුඩා සහ මධ්‍ය පරිමාණ අස්තිත්වයන් (SME) සඳහා වන ශ්‍රී ලංකා මුල්‍ය වාර්තාකරණ ප්‍රමිත ( SLFRS) වලට අනුකූලව මෙම මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ගැන කළමණාකරන කමිටුව වගකිව යුතුය.

කමිටුව වෙනුවෙන් සහ කමිටුවේ නාමයෙන් අනුමත කර අත්සන් කළේ :

..................................................... ...........................................................

එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම,
සභාපති,
2019 ජනවාරි
කොළඹ.

කමිටු සාමාජික.

## ආදායම් හා වියදම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | *2017* *රු.* | *2016* *රු.* |
|---|---|---|---|
| ආදායම් | 15 | 1,066,682,672 | 887,909,185 |
| සෘජු මෙහෙයුම් වියදම් | | (441,137,660) | (394,723,627) |
| දළ අතිරික්තය | | **625,545,012** | **493,185,558** |
| වෙනත් ආදායම් | 16 | 81,217,405 | 67,244,564 |
| පරිපාලන වියදම් | | (198,151,774) | (163,565,062) |
| අලෙවි කරන වියදම් | | (7,780,473) | (12,315,736) |
| මූල්‍ය විදයම් | 17 | (1,718,415) | (2,139,509) |
| වෙනත් වියදම් | 18 | (5,705,444) | (13,433,026) |
| බදු වියදමට පෙර අතිරික්තය | 19 | **493,406,310** | **368,976,789** |
| ආදායම් බදු වියදම් | | - | - |
| ආදායම් බදු වියදමට පසු අතිරික්තය | | **493,406,310** | **368,976,789** |

මූල්‍ය ප්‍රකාශන කියවිය යුත්තේ පදනමෙහි මෙම මූල්‍ය ප්‍රකාශනවල සංගතික කොටස්වන අදාළ සටහන් සමග එක්ව ගෙනය.

## අරමුදල් වෙනස්වීම් ප්‍රකාශය

දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා,

| | *ප්‍රාග්ධන සංචිතය* | *එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක සමුච්චිත අරමුදල (ඒකාබද්ධ)* | *ප්‍රාග්ධන ආධාර අරමුදල* | *(CHOGM) 2013 අරමුදල* | *එකතුව සංචිත* |
|---|---|---|---|---|---|
| | *රු.* | *රු.* | *රු.* | *රු.* | *රු.* |
| 2016 ජනවාරි 01 දිනට ශේෂය | 925,522 | 996,497,341 | 385,777,963 | 45,700,843 | 1,428,901,669 |
| වර්ෂයෙහි අතිරික්තය/මාරු කිරීම් | - | 368,976,789 | - | (1,879,476) | 367,097,313 |
| වර්ෂය තුළ පාවිච්චියට ගත් | - | - | (10,577,796) | (10,251,180) | (20,828,976) |
| **2016 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂය** | **925,522** | **1,365,474,130** | **375,200,167** | **33,570,187** | **1,775,170,006** |
| වර්ෂය තුළ අතිරික්තය | - | 493,406,310 | - | - | 493,406,310 |
| වර්ෂය තුළ භාවිතය | - | - | (10,557,797) | (11,999,300) | (22,577,097) |
| **2017 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂය** | **925,522** | **1,858,880,440** | **364,622,370** | **21,570,887** | **2,245,999,219** |

මූල්‍ය ප්‍රකාශන කියවිය යුත්තේ පදනමෙහි මෙම මූල්‍ය ප්‍රකාශනවල සංගතික කොටස්වන අදාළ සටහන් සමග එක්ව ගෙනය.

## අරමුදල් වෙනස්වීම් ප්‍රකාශනය

| දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | *සටහන* | *2017* *රු.* | *2016* *රු.* |
|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ | | | පුනප්‍රකාශය |
| බදු වියදමට පෙර අතිරික්තය | | 493,406,310 | 368,976,790 |
| **මුදල් නොවන ආදායම් සහ වියදම්වලට ගැලපිලි-** | | | |
| දේපළ පිරියත සහ උපකරණ ක්ෂය | | 77,249,072 | 68,020,382 |
| අස්පෘෂ්‍ය වත්කම් ක්‍රමක්ෂය | | 1,178,717 | 450,083 |
| පොළී ආදායම | | (106,633,684) | (35,547,753) |
| විශ්‍රාම පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන | | 9,867,016 | 7,741,380 |
| වානිජ සහ අනෙකුත් ලැබිය යුතු දෑ ප්‍රතිපාදන/ලියා හැරීම් | | - | (17,512,4150) |
| අස්පෘශ්‍ය වත්කම් ලියාහැරීම් | | 2,488,239 | - |
| තොග සඳහා අධි වෙන්කිරීම් ප්‍රතිවර්ත්‍ය කිරීම් | | (4,773,288) | (5,528,360) |
| වානිජ, ව්‍යවස්තාපිත සහ වෙනත් ගෙවිය යුතු දෑ ප්‍රතිවර්ත්‍ය කිරීම්/ආපසු ලියා හැරීම් | | - | (6,539,390) |
| දේපළ පිරියත සහ උපකරණ ඉවත් කිරීම් අලාභ | | - | 13,228,459 |
| කල්බදු පොළිය | | 1,391,757 | 1,892,087 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | | **474,174,139** | **395,181,353** |

| දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | *2017* *රු.* | *2016* *රු.* |
|---|---|---|---|
| **වෙනස්වීම්** | | | |
| තොග | | (2,554,197) | (5,405,575) |
| වානිජ සහ වෙනත් ලැබිය යුතු දෑ | | (45,925,382) | (24,169,201) |
| තැන්පතු, කලින් ගෙවීම්, අත්තිකාරම් සහ වෙනත් | | (12,258,593) | (3,369,418) |
| වෙනත් ගෙවිය යුතු දෑ සහ වෙනත් ගෙවිය යුතු දෑ උපචිත | | 56,666,257 | 47,065,443 |
| **මෙහෙයුම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **470,102,224** | **409,302,602** |
| පාරිතෝෂික ගෙවීම් | | - | (4,533,908) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ඉපයුනු ශුද්ධ මුදල් ප්‍රමාණය** | | **470,102,224** | **404,768,694** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ** | | | |
| ලැබුන පොළී ආදායම් | | 71,779,563 | 35,133,400 |
| දේපළ පිරියත සහ උපකරණ මිළදී ගැනීම් | | (19,410,162) | (21,983,076) |
| අස්පෘෂ්‍ය වත්කම් මිළදී ගැනීම් | | - | (562,480) |
| ස්ථිර තැන්පතුවල ශුද්ධ ආයෝජන | | (809,800,643) | (77,174,782) |
| කෙරීගෙන යන වැඩවල වර්ෂය තුළ එකතු කිරීම් | | (3,874,104) | - |
| ස්ථාවර වත්කම් සහ පරිභෝජනීය භාණ්ඩ ඉවත් කිරීමෙන් ලැබීම් | | 145,445 | 32,161,964 |
| සේවක මණ්ඩල ණය වැඩිවීම් | | (9,459,345) | (3,508,414) |
| | | **34,314,127** | **44,092,121** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල්** | | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ** | | | |
| විශේෂිත අරමුදල්වල අඩුවීම | | (22,577,097) | (19,171,023) |
| වර්ෂය තුළ ගෙවූ කල්බදු වාරිකය | | (4,994,163) | (6,385,920) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වල භාවිත කළ ශුද්ධ මුදල්** | | **(27,571,260)** | **(25,556,943)** |
| මුදල් සහ මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | (328,088,283) | (343,278,363) |
| වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ | | (433,420,846) | 90,142,483 |
| වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් සමාන දෑ | 9 | **105,332,563** | **433,420,846** |

මූල්‍ය ප්‍රකාශන කියවිය යුත්තේ පදනමෙහි මෙම මූල්‍ය ප්‍රකාශනවල සංගතික කොටස්වන අදාළ සටහන් සමග එක්ව ගෙනය.

## ප්‍රකාශන මත සටහන්

2017දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා,

**1. ගිණුම්කරන ප්‍රතිපත්ති**

1.1 *වාර්තාකරන අස්තිවෙය :*

එස්. ඩබ්. අර්. ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම ("පදනම") 1975 අංක 02 දරන එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක පදනම් නීතිය යටතේ ජාතික මන්ත්‍රණ සභාවෙන් ස්ථාපනය කර ඇත. ප්‍රධාන මෙහෙයුම් ස්ථානයෙහි ලියාපදිංචි කාර්යාලය, කොළඹ 07. බෞද්ධාලෝක මාවතෙහි පිහිටුවා ඇත.

**ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය**

එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක පදනම ජාත්‍යන්තර සමගිය, අවබෝධතාව සහ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සහ දේශපාලනික, අධ්‍යාපනික, සංස්කෘතික සහ සමාජීය ක්ෂේත්‍රවල මෙන්ම ජාත්‍යන්තර කටයුතු පිළිබඳ දැනීම ව්‍යාප්ත කිරීමත් ජාත්‍යන්තර අර්බුද අධ්‍යයනයට සහ සංවාදයට දිරිදීම සහ ප්‍රවර්ධනය උදෙසා කාර්යාල සඳහා පරිශ්‍රයන් බදුදීම සහ මහජන අවශ්‍යතා සඳහා ශාලා කුළියට දීම පදනමෙහි මෙහි ප්‍රධාන ක්‍රියාකාරකම්ය.

**ජාත්‍යන්තර අධ්‍යයනයන් සඳහා බණ්ඩාරනායක කේන්ද්‍රය**

ජාත්‍යන්තර සබඳතා, ජාත්‍යන්තර සාම නීති, තානාපති විෂයයන් ආදියෙහි සෑම අංශයකටම අදාළ අධ්‍යනයන් සහ පර්යේෂණ දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම කේන්ද්‍රයේ ප්‍රධාන ක්‍රියාකාරකම්ය.

1.2 **සූදානම් කිරීමේ පදනම**

(a) **අනුකූලතා ප්‍රකාශය**

2017 දෙසැම්බර් මස 31 වැනි දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය, ආදායම් සහ වියදම් ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශවලට සටහන්වලින් පදනමේ මූල්‍ය ප්‍රකාශ සමන්විත වේ.

**මිනුම් කිරීම් පදනම**

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරනු ලැබ ඇත්තේ ඓතිහාසික පිරිවැය මතය. උද්ධමන සාධක වෙනුවෙන් ගැලපිළි මූල්‍ය ප්‍රකාශවල සිදු කර නැත.

(b) **ව්‍යවහාරික හා ඉදිරිපත් කිරීම් මුදල්**

මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ පදනමේ ව්‍යවහාරික මුදල වන ශ්‍රී ලංකා රුපියල්වලින් ය.

(c) **ඇස්තමේන්තු හා විනිශ්චයන් භාවිතය**

SME සඳහා SLRFS ප්‍රමිතවලට අනුගතව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී මිනුම්කරණ ප්‍රතිපත්ති සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයන් කෙරෙහි යොදා ගැනීමේදී බලපානු ලබන විනිශ්චයන් ඇස්තමේන්තු කිරීම් සහ උපකල්පන සිදු කිරීම කළමණාකාරිත්වයෙන් අවශ්‍ය කෙරේ. ඇස්තමේන්තු සහ ආශ්‍රිත උපකල්පන වාතාවරනයන් යටතේ හේතු සාධක යැයි විශ්වාස කරනු ලබන විවිධ සාධක සහ ඓතිහාසික පළපුරුද්ද මත පදනම් වේ, වෙනත් මූලාශ්‍රයන්ගෙන් ක්ෂනිකව පෙන්නුම් කරනු නොලබන වත්කම් හා වගකීම්වල ධාරණ අගය පිළිබඳව විනිශ්චය කිරීම එහි ප්‍රතිඵලයක් වන්නේ ය. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලින් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ අනුයුක්ත උපකල්පන ප්‍රගාමීව සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තු කරන ලද කාලපරිච්ඡේදය තුළ ගිණුම්කරන ඇස්තමේන්තු සංශෝධනයන් අදාළ වනුයේ සංශෝධනයන් මුදල් වර්ෂයට පමණක් බලපානවිට හෝ සංශෝධනය කරනු ලබන කාලපරිච්ඡේදයට සහ අනාගත කාලපරිච්ඡේදවලට බලපාන්නේ නම් සහ සංශෝධනය ප්‍රවර්තන සහ අනාගත මුදල් වර්ෂවලට බලපාන්නේ නම් පමණකි.

1.3 **සැලකිය යුතු ගිණුම්කරන ප්‍රතිපත්ති**

මෙම මූල්‍ය ප්‍රකාශනවලින් ආවරණය වන සියලු කාලපරිච්ඡේදවලට පහත සඳහන් කරනු ලබන ගිණුම්කරන ප්‍රතිපත්ති සංගතිකව භාවිතා කරනු ලැබ ඇත.

(a) **විදේශීය මුදල් ගණුදෙනු**

විදේශීය මුදල්වලින් කරනු ලබන ගණුදෙනු ඒ ඒ ගණුදෙනු සිදු වූ දිනවල බලපැවැත් වූ විනිමය අනුපාතයන් අනුව රුපියල්වලට පරිවර්තනය කර ඇත. වාර්තා කරන ලද දිනට විදේශීය මුදලින් දක්වෙන ලද මූල්‍යමය වත්කම් හා වගකීම් රුපියල්වලට පරිවර්තනය කර ඇත්තේ වාර්තා කරනු ලබන දිනට බලපැවැත්වූ විනිමය අනුපාතයටය. පරිවර්තනයන්ගෙන් උද්ගතවන විදේශ විනිමය වෙනස්කම් ආදායම් හා වියදම් ප්‍රකාශනයෙහි ඒ අයුරින් හඳුනාගෙන ඇත.

(b) **දේපළ පිරියත සහ උපකරණ**

(i) **භාරගැනීම් සහ මිනුම්කරණය :**

සමුච්චිත ක්ෂය සහ හානිකරන අලාභ අඩුකළ පිරිවැයට දේපළ පිරියත සහ උපකරණ මිනුම් කරනු ලබයි.

වත්කම පවරා අත්පත් කරගැනීමට සහ වත්කම් ක්‍රියාත්මක තත්ත්වයට ගෙනඒමට ඍජුවම අදාළ වන වියදම් පිරිවැයට ඇතුළත්ය. දේපළ පිරියත සහ උපකරණවල ධාරණ අගය ඒවායෙහි අපහරණ උත්පාදන සමග සැසඳීමෙන් දේපල පිරියත සහ උපකරණ අපහරණය කිරීමේ ලැබීම්/අලාභ ගණනය කරනු ලැබ ආදායම් සහ වියදම් ප්‍රකාශනයෙහි "අනෙකුත් ආදායම්" හඳුනා ගැනේ.

(ii) **ක්ෂය**

වත්කමෙහි ප්‍රයෝජනවත් ඇස්තමේන්තුගත ආයුකාලය සඳහා හීනවන ශේෂ ක්‍රමය අනුව එස්. ඩබ්. ආර්.ඩී. බණ්ඩාරනායක අනුස්මරණ පදනමෙහි සහ CHOGAM අරමුදලෙහි ක්ෂය වීම ආදායම් හා වියදම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලබයි. ප්‍රවර්තනාත්මක හා සංසන්දනාත්මක කාල පරිච්ඡේද වෙනුවෙන් වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයුකාලය පහත සඳහන් පරිදි ය.

එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක අනුස්මරණ පදනම

| | *ක්ෂය අනුපාත* |
|---|---|
| ගොඩනැගිලි | 2% |
| පුස්තකාල පොත් | 20% |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | 10% |
| මෝටර් රථ | 25% |
| ගෘහ භාණ්ඩ සහ වැද්දුම් | 20% |
| සම්මන්ත්‍රණ පද්ධතිය | 12.5% |
| අනෙකුත් උපකරණ | 20% |
| කලාල සහ තිර | 33.3% |
| පිඟන් සහ හැඳි ගැරුප්පු | 20% |
| විදුලි උපකරණ | 20% |
| විදුලි උපකරණ | 20% |
| ලිනන් | 12.5% |
| කන්ටේනරය | 10% |
| මාර්ග | 10% |
| වෙළෙඳ කුටි | 10% |

CHOGAM 2013 අරමුදලේ වත්කම්

| | |
|---|---|
| හයිබ්‍රිඩ් ගොඩනැගිල්ල | 3% |
| SBMEC ශාලා ගොඩනැගිල්ල | 2% |
| PVC ආවරණ | 50% |
| මෝටර් රථ | 25% |
| ගෘහ භාණ්ඩ උපකරණ | 20% |

1.3 **සැලකිය යුතු ගිණුම්කරන ප්‍රතිපත්ති (සම්බන්ධවයි)**

(c) **අස්පෘශ්‍ය වත්කම**

පරිගණක මෘදුකාංග බලපත් ප්‍රාග්ධනීකරණය කර ඇත්තේ විශේෂිත මෘදුකාංග අත්පත් කර ගැනීමට සහ භාවිතයට ගෙන ඒමට දරන ලද පිරිවැය පදනම් කර ගනිමින් ය. මෙය පිරිවැය හීනවන ශේෂ ක්‍රමය මත ඒවායෙහි ප්‍රයෝජනවත් ආයුකාලය වන වසර 8ක කාල සීමාව තුළ ක්‍රමක්ෂය කරනු ලබයි.

(d) **කල්බදු වත්කම්**

මූල්‍ය කල්බදු යටතේ වන දේපළ පිරියත සහ උපකරණ (කල්බදු අයිතමවල අයිතියට ආශ්‍රීත සියලුම වියදම් සහ ප්‍රතිලාභ එළදායී වශයෙන් අවසානයේ පදනමට මාරු කරනු ලබන) යථෝක්ත කල්බදු වත්කම් මගින් ඵල ප්‍රයෝජන ලැබීමට කාලපරිච්ඡේද තුළ දී ඒවායේ මුදල් වටිනාකම ප්‍රාග්ධනීකරණය කර ක්ෂය/ක්‍රමක්ෂය කරනු ලැබේ. කල්බදුකරුට ගෙවිය යුතු අනුභූති මුල් මුදල වගකීමක් ලෙස පෙන්වනු ලබයි.

එක් එක් මුදල් වර්ෂයට අදාළ කල්බදු වගකීමේ පොළී ප්‍රමාණය එක් එක් කාලපරිච්ඡේදය අවසානයේ ඒකාකාරී අනුපාතයක් විදහා දක්වීම පිණිස ඉතිරිවී ඇති වගකීම ක්ෂය කාලපරිච්ඡේදය තුළ ආදායම් සහ වියදම් ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබේ.

(e) **තොග**

තොග පිරිවැයට අගය කරනු ලැබේ. තොගවල පිරිවැය "පෙර ඇතුළු පෙර නිකුතු" ප්‍රතිපත්තිය මත පදනම් වන අතර තොග අත්පත් කර ගැනීමේ සහ තොග දැනට පවත්නා ස්ථානයට සහ ඒතත්වයට ගෙන ඒමට දරන ලද වියදම් පිරිවැයට ඇතුළත්ය.

(f) **ආයෝජන**

භාණ්ඩාගාර බිල්පත්වල සහ ස්ථිර තැන්පතුවල කෙටි කාලීන ආයෝජන ක්‍රමක්ෂය පිරිවැයට අගය කරනු ලබයි.

(g) **වාණිජ්‍ය අනෙකුත් ලැබිය යුතු දෑ**

අනෙකුත් ලැබිය යුතු දෑ අපේක්ෂිත උපලබ්ධි අගයට සටහන් කර පවත්වාගෙන යනු ලැබේ. වර්ෂය අවසානයේ සියලුම ලැබිය යුතු ප්‍රමාණයන් සමාලෝචනය කර ඒ පදනමින් බොල් සහ අඩමාන ලැබිය යුතු දෑ ඇස්තමේන්තු කෙරේ.

(h) **මුදල් සහ මුදල් සමාන දෑ**

අත ඉතිරි මුදල්, ඉල්ලූ විගස මුදාහරින බැංකු තැන්පතු මුදල්වලින්, මුදල් සහ මුදල් සමාන දෑ සමන්විතය.
මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙන් පරමාර්ථ උදෙසා අත ඉතිරි මුදල්, ඉල්ලූ විගස මුදාහරිනු ලබන බැංකු තැන්පතු සහ ශුද්ධ බැංකු අයිරාවලින් මුදල් සහ මුදල් සමාන දෑ සමන්විත වේ. බැංකු අයිරා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වගකීම්වල ඇතුළත්ය.

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

වක්‍ර ක්‍රමය අනුගමනය කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර ඇත.

(i) **හානිකරණය**

පදනමේ මූල්‍ය නොවන වත්කම්වල ධාරණ අගයන් හාණිකරණයක් සිදුවන බවට හැඟවීමක් ඇත්දැයි නිශ්චය කිරීමට වාර්තා කරන දිනයක් පාසා සමාලෝචනය කෙරේ. කවර හෝ හැඟවීමක් පවත්නේ නම් වත්කමෙහි අයකරගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලබයි.

වත්කමක ධාරණ අගය අයකර ගත හැකි ප්‍රමාණය ඉක්මන්වන්නේ නම් හාණිකරන අලාභයක් හඳුනා ගනු ලබයි. හානිකරණ අලාභ ආදායම් සහ වියදම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලබයි.

(j) **වත්කම් හා ප්‍රතිපාදන**

අතීත ප්‍රතිඵලවල වගකීමක් වශයෙන් ප්‍රවර්තන බැඳීමක් පවත්නා විට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වගකීම් ලෙස හඳුනාගනු ලබන අතර එය සමථය කිරීම ආර්ථික ප්‍රතිලාභවල අන්තර්ගතව පවත්නා සම්පත් පිටතට ගලායාම ප්‍රතිඵලයක් වශයෙන් සිදුවන බව අපේක්ෂා කරනු ලබයි. ණය හිමියන් ඉල්ලුම්කළ විට ගෙවිය යුතු බැඳීම් හෝ වාර්තා කරන දිනයෙන් එක් වසරක් ඇතුළත ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වත්කම් ලෙස සැලකේ. වාර්තා කරන දිනයෙන් එක් වසරකට පසුව ගෙවිය යුතු වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම නොවන වත්කම් ලෙස සලකනු ලබයි.

පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස විශ්වාස කටයුතු අයුරින් ඇස්තමේන්තු කළ හැකි නෛතික හෝ නිර්මාණාත්මක වගකීමක් පදනමට වර්තමානයෙහි ඇත්තේ නම් සහ වගකීම් සමථය කිරීමට ආර්ථික ප්‍රතිලාභවල පිටතට ගලා යාමට අවශ්‍යතාවක් තිබිය හැකි නම් ප්‍රතිපාදනයක් හඳුනාගනු ලබයි.

(k) **විශේෂිත අරමුදල්**

හඳුනා ගත් කර්තව්‍යයන් සඳහා භාවිතා කිරීමට අරමුදල් ලැබීමේ දී එකී කර්තව්‍යය වෙනුවෙන් දරන ලද වියදම් සමග ගැළපීමට එවැනි අරමුදල් විශේෂිත අරමුදල් ගිණුමක රඳවාගෙන ආදායම් හා වියදම් ප්‍රකාශනයට මාරු කරනු ලැබේ. භාවිතා නොකළ අරමුදල් ඒවා අවශ්‍යවන තෙක් අදාළ අරමුදල් ගිණුම්වල රඳවාගෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඇතුළත් කරනු ලැබේ.

(l) **බදුකරණය**

**ආදායම් බදුකරණය**

පදනම 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 7 (ඉ) ඡේදය යටතේ ආදායම් බද්දෙන් නිදහස් වේ.

(m) **සේවක ප්‍රතිලාභ**

(i) **නිර්වචිත ප්‍රතිලාභ සැළැස්ම**

පාරිතෝශිකය නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මකි. අදාළ ආඥා පනතෙහි විධිවිධානවලට අනුව පාරිතෝෂික ගෙවීමට පදනම වගකීමෙන් බැඳේ. සියලුම සේවකයින් වෙනුවෙන් ඔවුන්ගේ පළමු සේවා වසරෙන් පටන්ගෙන සම්පූර්ණ කළ සෑම අවුරුද්දකටම මුදල් වර්ෂයේ අවසාන මාසයන් අඩක් සමාන ප්‍රමාණයක් මත ගණනය කර ලද ප්‍රතිපාදනයක් මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි ඉදිරියට ගෙන එනු ලැබේ.

1983 අංක 12 පාරිතෝෂිත ගෙවීම් ආඥා පනත යටතේ සියලුම සේවකයින්ට ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන සපයා ඇත. ප්‍රතිපාදනය පදනමෙන් පරිභාහිරව අරමුදලක ආයෝජනය නොකෙරේ. ප්‍රතිපාදනය බාහිර අරමුදලකින් නඩත්තු නොවන අතර ආයුගණකව අගය කිරීමක් සිදු කිරීමක් ද නැත.

(ii) **නිර්වචිත දායකත්ව සැළැස්ම**

නිර්වචිත දායකත්ව සැලසුම්වල බැඳීම් මූල්‍ය ප්‍රකාශනයෙහි වියදම් කරනු ලැබූ සේ හඳුනා ගැනේ. පදනම විසින් සේවකයින්ගේ දළ ඉපැයීම්වලින් 12% සහ 03%ක් අනුපිළිවෙලින් අර්ථසාධක අරමුදල සහ භාරකාර අරමුදල වෙනුවෙන් දායක කරයි.

(n) **ආදායම**

**ආදායම හඳුනා ගැනීම**

පදනමට ගලා එන ආර්ථික ප්‍රතිලාභ සහ ආදායම සහ දරනු ලැබූ හෝ දැරීමට ඇති ආශ්‍රිත පිරිවැය විශ්වසනීය අයුරින් මිශ්‍ර කළ හැකිතාක් දුරට ආදායම හඳුනා ගැනේ. වෙළෙඳ වට්ටම් සහ පිරිවැටුම් බදු අත්හැර ප්‍රමාණය ලැබූ හෝ ලැබිය යුතු ප්‍රතිශ්ඨාව ලෙස සාධාරණ අගයට ආදායම මිනුම් කරනු ලබයි.

(o) **වියදම්**

පදනමේ වර්ෂයට අතිරික්තය ගණන් බැලීමේදී පදනමේ මෙහෙයුම් සහ ප්‍රාග්ධන වත්කම් ඵලදායී තත්වයෙන් නඩත්තු කිරීම සඳහා දැරූ සියලුම වියදම් ගිණුම් ගත කරනු ලැබේ.

(p) **මූල්‍ය ආදායම සහ වියදම**

ණය ගැණුම් මත පොළී වියදම්, මූල්‍ය වියදම් බැංකු ගාස්තු සහ හර බද්දෙන් මූල්‍ය වියදම් සමන්විතය. සියලුම ණය ගැනුම් පිරිවැය ආදායම් සහ වියදම් ප්‍රකාශනයෙහි සඳහන් කෙරේ.

(q) **සංසන්දනාත්මක තොරතුරු**

අවශ්‍ය තැන්හිදී ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම් සමග තහවුරුවීමට සංසන්දනාත්මක ඉලක්කම් පිළියෙළ කර සකස් කර තිබේ.

(r) **වාර්තාකර දිනට පසු ඇති වන සිදුවීම**

වාර්තාකරණයට පසු සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර අදාළ ගැලපිලි සහ හෙළිදරව් කිරීම් ඊට සම්බන්ධ මූල්‍ය ප්‍රකාශනවල සටහන්වල සඳහන් වේ.

(s) **බැඳීම් සහ සම්භාව්‍යතා**

අතීත සිදුවීම් සහ අනාගත සිදුවීම් සිදුවීම හෝ සිදු නොවීම මත පමණක් තහවුරු කෙරුනු ඇති පදනමෙහි පාලනයෙන් පරිබාහිරව වත්කම් හෝ වගකීම් බැඳීම් යනුවෙන් හැඳින්වේ. බැඳීම් සහ සම්භාව්‍යතා වගකීම් මූල්‍ය ප්‍රකාශනවලට සටහන්වල හෙළිදරව් කර ඇත.

## මූල්‍ය ප්‍රකාශන මත සටහන්

දෙසැම්බර් මස 31 වැනි දිනට

2.1 **දේපළ පිරියත සහ උපකරණ - නිදහස් වත්කම්**

| *පිරිවැය* | *2017 ජනවාරි මස 01 දිනට ශේෂය* | *එකතු කිරීම්* | *බැහැරලීම්* | *2017 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂය* |
|---|---|---|---|---|
| | *රු.* | *රු.* | *රු.* | *රු.* |
| ගොඩනැගිල්ල | 942,486,967.00 | - | - | 942,486,967.00 |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 12,100,000.00 | - | - | 12.100,000.00 |
| මෝටර් වාහන | 48,599,771.00 | - | - | 48,599,771.00 |
| අනෙකුත් උපකරණ | 16,932,786.00 | 8,335,658.00 | - | 25,268,444.00 |
| ගෘහ භාණ්ඩ සහ වැද්දුම් | 49,926,432.00 | 3,285,793.00 | - | 53,212,225.00 |
| බුමුතුරුණු සහ තිර රෙදි | 2,124,626.00 | - | - | 2,124,626.00 |
| පිඟන් කෝප්ප | 226,553.00 | - | - | 226,553.00 |
| විදුලි උපකරණ | 63,618,438.00 | 7,788,711.00 | - | 71,407,149.00 |
| කන්ටේනරය | 960,862.00 | - | - | 960,862.00 |
| මාර්ග ගිණුම | 32,717,258.00 | - | - | 32,717,258.00 |
| වෙළෙඳ කුටි | 4,962,395.00 | - | - | 4,962,395.00 |
| | **1,174,656,088.00** | **19,410,162.00** | | **1,194,066.251.00** |

| *සමුච්චිත අගය* | *2017 ජනවාරි මස 01 දිනට ශේෂය* | *වර්ෂයෙහි ක්ෂය* | *බැහැරලීම් මත ක්ෂය* | *2017 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂය* |
|---|---|---|---|---|
| | *රු.* | *රු.* | *රු.* | *රු.* |
| ගොඩනැගිල්ල | 57,974,210.00 | 7,457,915.00 | - | 75,432,125.00 |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,804,306.00 | 1,210,000.00 | - | 3,014,306.00 |
| මෝටර් වාහන | 36,958,401.00 | 9,305,252.00 | - | 46,263,653.00 |

| සමුච්චිත අගය | 2017 ජනවාරි මස 01 දිනට ශේෂය | වර්ෂයෙහි ක්ෂය | බැහැරලීම් මත ක්ෂය | 2017 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| අනෙකුත් උපකරණ | 4,469,620.00 | 4.141,334.00 | - | 8,610,954.00 |
| ගෘහ භාණ්ඩ සහ වැද්දුම් | 19,091,314.00 | 9,466,443.00 | - | 28,557,757,00 |
| බුමුතුරුණු සහ තිර රෙදි | 1,503,369.00 | 621,255.00 | - | 2,124,624.00 |
| පිඟන් කෝප්ප | 220,769.00 | 5,784.00 | - | 226,553.00 |
| විදුලි උපකරණ | 27,032,282.00 | 13,320,063.00 | - | 40,352,345.00 |
| කන්ටේනරය | 960,862.00 | - | - | 960,862.00 |
| මාර්ග ගිණුම | 12,326,761.00 | 3,271,726.00 | - | 15,598.487.00 |
| වෙළෙඳ කුටි | 4,962,395.00 | - | - | 4,962,395.00 |
| | **167,304,289.00** | **58,799,772.00** | - | **226,104,061.00** |
| **ශුද්ධ පොත් අගය** | **1,007,351,799.00** | | | **967,962,190.00** |

2.1 **දේපළ පිරියත සහ උපකරණ**

| පිරිවැය | 2017 ජනවාරි මස 01 වැනි දිනට ශේෂය | එකතු කිරීම් | බැහැරලීම් | 2017 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| පී.වී.සී. ආවරණ | 4,924,368 | - | - | 4,924,368 |
| Blockxi/x2/x3/x4 හයිබ්‍රිඩ් ගොඩනැගිල්ල | 7,053,000 | - | - | 7,053,000 |
| බුමුතුරුණු | 9,810.129 | | | 9,810,129 |
| විදුලි උපකරණ | 7,079,464 | | | 7,079,464 |
| ගෘහ භාණ්ඩ සහ වැද්දුම් | 22,758,252 | | | 22,758,252 |
| අනෙකුත් උපකරණ | 2,899,801 | | | 2,899,801 |
| SBMEC-F ශාලා ගොඩනැගිල්ල | 4,209.691 | - | | 4,209,691 |
| මෝටර් වාහන | 7,826,002 | | | 7,826,002 |
| | **66,560,707** | | | **66,560,707** |

| සමුච්චිත ක්ෂය කිරීම් | 2017 ජනවාරි මස 01 වැනි දිනට ශේෂය | වර්ෂය සඳහා ක්ෂය කිරීම් | බැහැරලීම් මත ක්ෂය | 2017 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| පී.වී.සී. ආවරණ | 4,924,369 | - | - | 4,924,369 |
| Blockxi/x2/x3/x4 හයිබ්‍රිඩ් ගොඩනැගිල්ල | 501,668 | 141,060 | - | 642,728 |
| බුමුතුරුණු | 7,008,450 | 3,270,043 | - | 10,278,493 |
| විදුලි උපකරණ | 3,401,464 | 1,415,893 | - | 4,817,357 |
| ගෘහ භාණ්ඩ සහ වැද්දුම | 10,783,881 | 4,551,650 | - | 15.335,531 |
| අනෙකුත් උපකරණ | 1,393,263 | 579,960 | | 1,973,223 |
| SBMEC-F ශාලා ගොඩනැගිල්ල | 249,212 | 84,194 | | 333,406 |
| මෝටර් වාහන | 4,728,213 | 1,956,500 | - | 6,684,713 |
| | **32,990,520** | **11,999,300** | - | **44,989,820** |
| **ශුද්ධ පොත් අගය** | **33,570,187** | | | |

2.3 **දේපළ පිරියත සහ උපකරණ**

| *පිරිවැය* | *2017 ජනවාරි මස 01 වැනි දිනට ශේෂය* | *වර්ෂය සඳහා ක්ෂය කිරීම්* | *බැහැරලීම් මත ක්ෂය* | *2017 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂය* |
|---|---|---|---|---|
| | *රු.* | *රු.* | *රු.* | *රු.* |
| මෝටර් වාහන | 25,800,000 | - | - | 25,800,000 |
| | **25,800,000** | - | - | **25,800,000** |

| *සමුච්චිත ක්ෂය කිරීම්* | *2017 ජනවාරි මස 01 වැනි දිනට ශේෂය* | *වර්ෂය සඳහා ක්ෂය කිරීම්* | *බැහැරලීම් මත ක්ෂය* | *2017 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂය* |
|---|---|---|---|---|
| | *රු.* | *රු.* | *රු.* | *රු.* |
| මෝටර් වාහන | 13,222,505 | 6,450,000 | - | 19,672,505 |
| | **13,222,505** | **6,450,000** | - | **19,672,505** |
| ශුද්ධ පොත් අගය | 12,577,495 | | | |

| **3. අස්පෘශ්‍ය වත්කම්** | *2017* | *2016* |
|---|---|---|
| *පිරිවැය* | *රු.* | *රු.* |
| වර්ෂය ආරම්භක ශේෂය | 4,988,554 | 4,426,072 |
| වර්ෂය තුළ එකතු කිරීම් | - | 562,480 |
| වර්ෂය තුළ ලියා හැරීම් | (2,488,239) | - |
| **වර්ෂය අවසානයේ ශේෂය** | **2,505,315** | **4,988,552** |
| **ක්‍රම ක්ෂය** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 2,438,066 | 1,957,959 |
| වර්ෂය තුළ ක්‍රමක්ෂය | 1,178,717 | 450,083 |
| බැහැරදීම් මත ක්‍රමක්ෂය | (2,488,237) | - |
| **වර්ෂ අවසානයේ ශේෂය** | **1,128,546** | **2,408,042** |

**4. ජංගම නොවන මූල්‍ය වත්කම්**

| | | |
|---|---|---|
| කාර්යය මණ්ඩල ණය | 31,569,796 | 28,061,174 |
| වර්ෂය ආරම්භක ශේෂය | 23,617,613 | 17,985,200 |
| වර්ෂය තුළ දෙන ලද ණය | (14,158,268) | (14,476,578) |
| වර්ෂය අවසානයේ ශේෂය | 41,029,141 | 31,569,796 |

**5. තොග**

| | | |
|---|---|---|
| තොගය | 14,367,540 | 16,586,631 |
| (-) තොග සඳහා ප්‍රතිපාදනය | (1,735,698) | (6,508,986) |
| | 12,631,842 | 10,077,645 |

| | 2017 රු. | 2016 රු. |
|---|---|---|
| **6. වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ** | | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ (6.1 සටහන) | 144,943,074 | 99,597,655 |
| වෙනත් ලැබිය යුතු දෑ ප්‍රතිපූර්ණය (6.2 සටහන) | 3,156,162 | 2,261,784 |
| විවිධ ණය ගැතියෝ (6.3 සටහන) | 242.010 | 326,010 |
| වෙනත් ලැබිය යුතු දෑ (6.4 සටහන) | 302,157 | 532,572 |
| | **148,643,403** | **102,718,022** |
| **6.1 වෙළෙඳ ලැබිය යුතු දෑ** | | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 203,488,703 | 158,143,285 |
| (-) වෙළෙඳ ණය ගැතියන් සඳහා ප්‍රතිපාදනය | (58,545,629) | (58,545,630) |
| | **144,943,074** | **99,597,655** |
| **6.2 වෙනත් ලැබිය යුතු දෑ (ප්‍රතිපූරණ)** | | |
| ලැබිය යුතු බදු කුළී | 35,512,908 | 34,618,530 |
| (-) ලැබිය යුතු බදු කුළි සඳහා ප්‍රතිපාදන | (32,356,746) | (32,356,746) |
| | **3,156,162** | **2,261,784** |
| **6.3 විවිධ ණය ගැතියෝ** | | |
| විවිධ ණයගැතියෝ | 1,233,748 | 1,317,748 |
| (-) විවිධ ණය ගැතියන් සඳහා ප්‍රතිපාදන | (991,738) | (991,738) |
| | **242,010** | **326,010** |
| **6.4 වෙනත් ලැබිය යුතු දෑ** | | |
| වෙනත් ලැබිය යුතු දෑ | 5,995,199 | 6,225,614 |
| (-) වෙනත් ලැබිය යුතු දෑ සඳහා ප්‍රතිපාදන | (5,693,042) | (5,693,042) |
| | **302,157** | **532,572** |
| **7. කෙටිකාලීන ආයෝජන** | | |
| ස්ථාවර තැන්පතු | 1,248,511,759 | 371,682,528 |
| භාණ්ඩාගාර බිල්පත් | - | 31,396,595 |
| | **1,248,511,759** | **403,079,123** |
| **8. තැන්පතු පෙර ගෙවීම් සහ අත්තිකාරම්** | | |
| සේවක අත්තිකාරම් | 3,545,838 | 882,245 |
| ආපසු ගෙවන තැන්පතු (8.1 සටහන) | 431,004 | 331,004 |
| පෙර ගෙවීම් | 3.342,920 | 3,454,923 |
| අත්තිකාරම් ගෙවීම් (8.2 සටහන) | 16,826,345 | 7,219.342 |
| | **24.146,107** | **11,887,514** |

| | 2017 රු. | 2016 රු. |
|---|---|---|
| **8.1 ආපසු ගෙවන අත්තිකාරම්** | | |
| ආපසු ගෙවන අත්තිකාරම් | 531,154 | 431,154 |
| (-) ආපසු ගෙවන අත්තිකාරම් සඳහා ප්‍රතිපාදන | (100,150) | (100,150) |
| | **431,004** | **331,404** |
| **8.2 අත්තිකාරම් ගෙවීම්** | | |
| අත්තිකාරම් ගෙවීම් | 19,568,804 | 9,961,801 |
| (-) අත්තිකාරම් ගෙවීම් සඳහා ප්‍රතිපාදන | (2,742,459) | (2,742,459) |
| | 16,826,345 | 7,219,342 |

**9. මුදල් සහ මුදල් සමාන දෑ**

| | | |
|---|---|---|
| බැංකුවේ මුදල් | 105,245,965 | 433,382,495 |
| අත ඉතිරි මුදල් | 86,598 | 38,351 |
| | **105,332,563** | **433,420,846** |

**10. විශේෂිත අරමුදල්**

| | | |
|---|---|---|
| ප්‍රාග්ධන ආධාර අරමුදල | 364,622,370 | 375,200,167 |
| CHOGAM 2013 අරමුදල | 21,570,886 | 33,570,186 |
| | **386,193,256** | **408,770,353** |

**11. මූල්‍ය කල්බදු වගකීම්**

| | | |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ ශේෂය | 17,827,360 | 24,213,280 |
| වර්ෂය තුළ ලබා ගැනීම් | - | - |
| වර්ෂය තුළ ගෙවීම් | (6,385,920) | (6,385,920) |
| වර්ෂය අවසාන ශේෂය | **11,441,440** | **17,827,360** |
| පොළි | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 2,455,868 | 6,225,614 |
| වර්ෂය තුළ එකතු කිරීම් | - | - |
| මුදල් ප්‍රකාශනයට අයකළ පොළි | (3,391,757) | (1,892,087) |
| වර්ෂය අවසාන ශේෂය | 1,064,111 | 2,455,868 |
| අවම කල්බදු ගෙවීමේ වර්තමාන අගය | 10,377,329 | 15,371,492 |
| **11.1 එක් වසරකට පසු ගෙවිය යුතු කල් බදු** | **5,883,497** | **10,887,660** |
| **11.2 එක් වසරක් තුළ ගෙවිය යුතු කල් බදු** | **4,493,832** | **4,493,832** |

| | 2017 රු. | 2016 රු. |
|---|---|---|
| **12. විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 51,253,741 | 48,046,269 |
| වර්ෂය තුළ සිදුකළ ප්‍රතිපාදන | 9,867,016 | 7,741,380 |
| වර්ෂය තුළ සිදුකරන ලද ගෙවීම් | - | (4,533,908) |
| වර්ෂය අවසාන ශේෂය | **61,120,757** | **51,253,741** |
| **13. වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ** | | |
| වෙළෙඳ ණය හිමියෝ | 43,673,411 | 38,526,001 |
| (-) වෙළෙඳ ණය හිමියන් ආපසු ලියාහැරීම් | - | (507,365) |
| වෙනත් ගෙවිය යුතු දෑ | 14,064,335 | 8,439,586 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 2,138,897 | 3,972,397 |
| අත්තිකාරම් සංචිත | 93,800,607 | 82,025,934 |
| | **153,677,250** | **132,456,553** |
| **14. උපලබ්ධි වියදම්** | | |
| ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ | 2,126,609 | 1,963,458 |
| ගෙවිය යුතු දිරි දීමනා | 74,191,281 | 44,179,125 |
| විවිධ උපලබ්ධි වියදම් | 15,895,245 | 6,876,568 |
| වෙනත් ගෙවිය යුතු බදු | 11,514,442 | 21,506,911 |
| (-) වෙනත් ගෙවිය යුතු බදු ලියා හැරීම් | - | (6,032,025) |
| නොගෙවූ වේතන | 949,047 | 714,506 |
| කුලීපිට ගැනුම් | - | 5,299 |
| ගිණුම්කරන වියදම් මූල්‍ය | - | 400,000 |
| විගණන ගාස්තු - උපචිත වියදම් | 2,500,019 | 2,601,520 |
| දුරකථන ගාස්තු - ගෙවිය යුතු | 243,314 | 414,451 |
| ගෙවිය යුතු අතිකාල | 3,043,154 | 2,281,529 |
| උපචිත සුළු මුදල් වියදම් | - | 5,393 |
| රෙදිපිළි පිරිසිදු කිරීමේ වියදම් | - | 100,816 |
| | **110,463,111** | **75,017,551** |
| **15. ආදායම්** | | |
| කුලී ආදායම් | 645,568,959 | 563,303,069 |
| බදු කුලී ආදායම | 197,250,925 | 181,383,158 |
| පොලී ආදායම | 106,633,684 | 35,547,753 |
| කොමිස් ආදායම | 98,339,191 | 98,899,383 |
| භාෂා පාඨමාලා ගාස්තු | 6,396,900 | 8,775,822 |
| ජාත්‍යන්තර සබඳතා පාඨමාලා ගාස්තු | 12,493,013 | - |
| | **1,066,682,672** | **887,909,185** |
| **16. වෙනත් ආදායම්** | | |
| සීමාකළ අරමුදල්වල ක්‍රමක්ෂය | 22,577,096 | 22,708,453 |
| විවිධ ලැබීම් ආදායම | 3,146,769 | 3,555,109 |

| | 2017 රු. | 2016 රු. |
|---|---|---|
| දුරකථන ආදායම | 10,438,692 | 9,846,878 |
| වත්කම් බැහැර කිරීම් ලැබීම් | 30,000 | - |
| මිශ්‍ර ආදායම් | 493,287 | 242,355 |
| වෙනත් ලැබිය යුතු දෑ සඳහා අධි ප්‍රතිපාදන | - | 6,147,577 |
| වෙනත් ආදායම් | 38,998,854 | 110,664 |
| පුස්තකාල දෙපාර්තමේන්තුව | 316,155 | 110,757 |
| අනෙකුත් ආදායම් | 144,956 | - |
| සෙමින් සංචරනය වන තොග සඳහා ප්‍රතිපාදන | 4,773,288 | 5,528,360 |
| අඩමාණ ණය අධි ප්‍රතිපාදන | - | 11,556,396 |
| සුන්බුන් අයිතම බැහැරලීම් ආදායම | 115,445 | - |
| වෙළෙඳ හිමියන් ආපසු ලියා හැරීම් | - | 507,365 |
| TDL ආපසු ලියා හැරීම් | - | 6,032,025 |
| විදේශ විනිමය ලාභය | 212,863 | 898,625 |
| | **81,247,405** | **67,244,564** |

**17. මූල්‍ය වියදම්**

| | | |
|---|---|---|
| කල්බදු පොළී | 1,391,757 | 1,892,087 |
| බැංකු ගාස්තු | 326,658 | 247,422 |
| | **1,718,415** | **2,139,509** |

**18. වෙනත් වියදම්**

| | | |
|---|---|---|
| වත්කම් බැහැරලීම් | - | 7,535,915 |
| සුන්බුන් අයිතම බැහැරලීම් ආදායම් | - | 5,692,634 |
| ප්‍රදාන | 40.000 | 12,919 |
| වෙනත් ලැබිය යුතු දෑ සඳහා ප්‍රතිපාදන | - | 191.558 |
| රඳවා ගැනීම් බදු වියදම් | 5,665,444 | - |
| | 5,705,444 | 13,433,026 |

**19. බදු පෙර අතිරික්තය**

බදු පෙර අතිරික්තය නිර්නය කිරීමේ දී පහත දැක්වෙන අයිතම වියදම් ලෙස හඳුනාගෙන ඇත.

| | | |
|---|---|---|
| කාර්යය මණ්ඩල පිරිවැය | 268,410,805 | 197,825,142 |
| නිර්වචිත දායකත්ව සැලසුම් පිරිවැය -සේ.අ.අ. සහ සේ.නි.අ. | 15,922,533 | 13,205,298 |
| නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය - පාරිතෝෂික | 9,867,016 | 7,741,380 |
| ක්ෂය සහ ක්‍රමක්ෂය | 78,427,789 | 68,470,465 |
| විගණකවරුන්ගේ ගාස්තු | 1,200,000 | 1,350,000 |

**20. සම්බන්ධිත පාර්ශව ගණුදෙනු**

**ප්‍රමුඛ කළමනාකාරීත්ව පුද්ගලයින් සමග ගණුදෙනු**

පදනමෙහි කළමණාකාරිත්ව කමිටුවේ සාමාජිකයින් පදනමෙහි ප්‍රමුඛ කළමණාකාරිත්ව පුද්ගලයින් වශයෙන් සලකනු ලබති. ප්‍රමුඛ කළමණාකාරිත්ව පුද්ගලයින්ට ගෙවන ලද අනුපූරක ගෙවීම් පහත දැක්වෙන අයුරින්ය.

| | 2017 රු. | 2016 රු. |
|---|---|---|
| කෙටිකාලීන ප්‍රතිලාභ | - | - |
| | - | - |

**21. බැඳීම් සහ අනිශ්චිතතා**

පහත දැක්වෙන දැ හැරුණු විට වාර්තා කරන කාල පරිච්ඡේදය අවසන් වන විට මූල්‍ය ප්‍රකාශනවල ගැලපිලි කිරීමට හෝ හෙළිදරව් කිරීමට අවශ්‍ය සැලකිය යුතු ප්‍රාග්ධන බැඳීම් හෝ අනිශ්චිතතා නොතිබුණේය.

**22. නඩු සහ හිමිකම් පෑම්**

වාර්තාකරන දිනට පදනමට එරෙහිම පහත දැක්වෙන නඩු සහ හිමිකම් පෑම් පවතියි.

**22.1** එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක පදනමෙහි රැකියාව අවසන් කිරීම පිළිබඳව, පදනමෙහි කළින් සේවිකාවක් වූ ඉන්ද්‍රානි කලුආරච්චි මිය රු. 150,000 හිමිකමක් ඉදිරිපත් කරමින් පදනමට එරෙහිව නඩුවක් පවරා ඇත. මෙම නඩුව සාර්ථක අන්දමින් විත්තිවාචනය කරන ලදුව 2019 ජනවාරි මස 11 වැනි දින මහාධිකරණය විසින් නිශ්ප්‍රභා කරන ලදී. මෙම විෂය කාරණය අවසාන නිර්ණය පිණිස කම්කරු විනිශ්චය සභාව විසින් විභාග කරනු ඇත.

22.2 පදනමෙහි කලින් සේවකයෙකු වූ ප්‍රනාන්දු මහතා විසින් නැවත සේවයෙහි පිහිටුවන ලෙස ඉල්ලීම පදනමට එරෙහිව නඩුවක් පවරා ඇත. ප්‍රනාන්දු මහතා අවසන් වරට ලැබූ වැටුප මෙන් 15 ගුණයක වන්දියක් ඔහුට ප්‍රදානය කිරීමට තීරණය කරමින් කම්කරු විනිශ්චය සභාව 2018 නොවැම්බර් මස 30 වැනි දින විභාගය අවසන් කළේය. එසේ වුවද එම නියෝගයට එරෙහිව මහාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කරන ලදී. මේ දක්වා අභියාචනය විභාග කිරීමට දින නියම කර නැත.

**23. වාර්තා කරන දිනට පසුව සිදුවන සිදුවීම්**

මූල්‍ය ප්‍රකාශනවල ගැලපිලි කිරීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන සැලකිය යුතු සිදුවීම් වාර්තා කරන දිනට පසුව සිදු වී නැත.

**24. මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම**

මෙම මූල්‍ය ප්‍රකාශන කළමණාකාරිත්ව මණ්ඩලයෙන් අනුමත කරන ලදුව 2018 දෙසැම්බර් මස 13 වැනි දින නිකුත් කිරීමට බලය දෙන ලදී.

03 - 659

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

පීවී 89118.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "සිග්මාලොජික් (ප්‍රයිවට්) ලිමිටඩ්"හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2012.10.30 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "සිග්මාලොජික් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "සිග්මාලොජික් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 පෙබරවාරි මස 16 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03 - 634

පීවී 83537.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "ෆෙයාවේ මැරිටයිම් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්"හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2012.01.09 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "ෆෙයාවේ මැරිටයිම් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "ෆෙයාවේ මැරිටයිම් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 පෙබරවාරි මස 16 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03 - 635

---

පීවී 75946.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "ඩිලාන් කෝප් (ප්‍රයිවට්) ලිමිටඩ්"හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2010.12.09 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "ඩිලාන් කෝප් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ (හැඳළ - උප කාර්යාලය) වත්තල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, ඇලකන්ද - 170 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හැඳළ පිහිටි මරදාන පාර, වරිපනම් අංක 20/A, 20/03, 20/05 දරන "කොස්ගහවත්ත නොහොත් කොස්ගහකනත්ත" යයි කියනු ලබන බලයලත් මානක තැන එච්. ආර්. සමරසිංහ යන අය විසින් සාදන ලද 2015 දෙසැම්බර් මස 08 දාතම හා අංක 7569

දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : නැසීගිය විල්බට් අමරකෝන්, ජේ. ඩී. එෆ්. නානායක්කාර, පී. එස්. එස්. පෙරේරා සහ විල්සන් කුරුප්පු යන අයගේ ඉඩම්, නැගෙනහිරට : ඇන්ටනි පෙරේරා යන අයගේ ඉඩම, දකුණට : ඇන්ටනි පෙරේරා ෂෙරින් නවරත්න, පප්ති අමල්, ගාමිණි පෙරේරා යන අයගේ ඉඩම් සහ අංක 3227A දරන පිඹුරේ ලොට් 2 සහ බස්නාහිරට : අංක 3227A දරන පිඹුරේ ලොට් 2 සහ මරදාන පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහ තුනයි දශම පහයි තුනක් (A:0, R:1, P:13.53) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 7569 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී හැඳළ පිහිටි මරදාන පාර, වරිපනම් අංක 20/A, 20/03, 20/05 දරන "කොස්ගහවත්ත නොහොත් කොස්ගහකනත්ත" යයි කියනු ලබන බලයලත් මානක තැන එච්. ආර්. සමරසිංහ යන අය විසින් සාදන ලද 2001 පෙබරවාරි මස 08 දාතම හා අංක 3227A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය බෙදා වෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : නැසීගිය විල්බට් අමරකෝන්, ජේ. ඩී. එෆ්. නානායක්කාර, පී. එස්. එස්. පෙරේරා සහ විල්සන් කුරුප්පු යන අයගේ ඉඩම්, නැගෙනහිරට : ඇන්ටනි පෙරේරා යන අයගේ ඉඩම, දකුණට : ඇන්ටනි පෙරේරා, ෂෙරින් නවරත්න, පප්ති අමල්, ගාමිණි පෙරේරා යන අයගේ ඉඩම් සහ බස්නාහිරට : මරදාන පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහ තුනයි දශම පහයි තුනක් (A:0, R:1, P:13.53) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 3227 A දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව L 160/115 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

03 - 843/2

---

## සම්පත් බැංකුව පීඑල්සී
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එස්. සී. සී. කොන්ෆෙක්ෂනරිස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0037 1000 9642.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2018.11.29 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන ආර්. ජී. ඩී. සුනාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2015 ජූලි මස 30 දාතම හා අංක 4554 දරන සහ ආර්. අලහේන්ද්‍ර යන අය විසින් ලියා සහතික කරන ලද 2018 සැප්තැම්බර් මස 26 දාතම හා අංක 4490 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති බදුකර දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ එස්. සී. සී. කොන්ෆෙක්ෂනරිස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 4554 සහ 4490 දරන බැඳුම්කර ප්‍රකාර අයවියයුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් දෙකෝටි අනූ හතර ලක්ෂ පනස් හතර දහස් නමසිය දහ හතයි ශත තිහක (රු. 29,454,917.30) මුදලක් 2018 ඔක්තෝබර් 25 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දෙකෝටි අනූ හතර ලක්ෂ පනස් හතර දහස් නමසිය දහ හතයි ශත තිහක (රු. 29,454,917.30) මුදල ද, 2018 ඔක්තෝබර් මස 26 වැනි දින සිට අංක 4554 සහ 4490 දරන එකී බැඳුම්කර මත අයවියයුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙකෝටි අසූ හත් ලක්ෂ විසි පන් දහස් එකසිය තිස් පහයි ශත හැත්තෑ හතරක (රු. 28,725,135.74) මුදලක් සඳහා වාර්ෂිකව at the rate of Average Weighted Prime Lending Rate + Four per centum (4%) per annum (floor rate of 15% ) , බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 4554 සහ 4490 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, පාතදුම්බර කෝරළේ, උඩුගම්පහ කුණ්ඩසාලේ කොට්ඨාසයේ, බලගොල්ල නැගෙනහිර අංක 638 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කෙන්ගලල ග්‍රාමයේ පිහිටි "දැන් පල්ලේකැලේ ඉන්ඩස්ට්‍රියල් එස්ටේට් හි කොටසක් නිර්මාණය වන පල්ලේකැලේ" යයි කියනු ලබන බලයලත් මානක තැන ටී. පියසේන යන අය විසින් සාදන ලද 1987 සැප්තැම්බර් මස දාතම හා අංක 390/87 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය බෙදාවෙන්කොට ලොට්

20 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 15 (පාර සහ වෙන්කිරීම්), නැගෙනහිරට : ලොට් 19, දකුණට : ලොට් 4 (කාණුව සහ වෙන්කිරීම) සහ බස්නාහිරට : ලොට් 21 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් අටක් (A:0, R:0, P:38) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 390/87 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව D 29/72 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 390/87 දරන එකී පිඹුරේ නිරූපිත කාණුව සහ වෙන්කිරීම සහ මාර්ග සහ වෙන්කිරීම දිගේ හා ඒ මතින් උඩින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

03 - 843/1

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එන්. වී. පී. ශාන්ත.
ගිණුම් අංක : 0096 5000 1831.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2018.12.20 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. ඩී. එම්. විතානගේ යන අය විසින් ලියා සහතික කරන ලද 2017 අප්‍රේල් මස 04 දාතම හා අංක 1123 දරන සහ 2018 අගෝස්තු මස 17 සහ 20 දාතම හා අංක 2615 දරන උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ නවදෝව විතානගේ පුෂ්ප ශාන්ත නොහොත් නවදෝ විතානගේ පුෂ්ප ශාන්ත යන අය බන්ධනදායි වශයෙන් පැහැර ඇති හෙයින් ද, එකී අංක 1123 සහ 2615 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් තුන්කෝටි හය ලක්ෂ අනූ තුන් දහස් පන්සිය හැත්තෑවයි ශත අනූ නමයක (රු. 30,693,570.99) මුදලක් 2018 නොවැම්බර් මස 01 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් තුන්කෝටි හය ලක්ෂ අනූ තුන් දහස් පන්සිය හැත්තෑවයි ශත අනූ නමයක (රු. 30,693,570.99) මුදල ද, 2018 නොවැම්බර් මස 02 වැනි දින සිට අංක 1123 සහ 2615 දරන එකී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තිස් තුන් ලක්ෂයක (රු. 3,300,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) හා තවත් රුපියල් එක්කෝටි තිස්ලක්ෂ තිස්දෙදහස් පන්සියක (රු. 13,032,500) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනයි දශම දෙකයි පහක් (13.25%) හා තවත් රුපියල් එක්කෝටි තිස් හතර ලක්ෂයක (රු. 13,400,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවක් (15%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1123 සහ 2615 දරන උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දකුණු අලුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, කුරුඳුහේන - අංක 169A දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හේකිත්ත ග්‍රාමයේ පිහිටි 3 වන පටුමග, වරිපනම් අංක 19 - ක්‍රොක්ටේන් දරන "හෙදවකගහකුරුඳුවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ආර්. සමරසිංහ යන අය විසින් සාදන 2012 නොවැම්බර් මස 06 දාතම හා අංක 6602 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක A 4750 දරන P පිඹුරේ ලොට් 65, නැගෙනහිරට : අංක A 4750 දරන P පිඹුරේ ලොට් 67, දකුණට : අංක A 4750 දරන P පිඹුරේ ලොට් 69 සහ බස්නාහිරට : පාර (අංක A 4750 දරන P පිඹුරේ ලොට් 53) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ හතරයි දශම නමයයි බිංදුවක් (A:0, R:0, P:14.90) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 6602 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 01 වඩා නිවැරදිව පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී හේකිත්ත ග්‍රාමයේ පිහිටි "හෙදවකගහකුරුඳුවත්ත" යයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් සත්‍යාපනය කරන ලද

1963 මාර්තු 05 දාතම හා අංක A 4750 දරන P පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 66 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 65, නැගෙනහිරට : ලොට් 67, දකුණට : ලොට් 69 සහ බස්නාහිරට : පාර (ලොට් 53 වශයෙන් ලකුණුකොට ඇති වෙන්කිරීම) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ හතරයි දශම තුනයි හයක් (A:0, R:0, P:14.36) විශාල ඉඩම් කොටස එකී අංක A 4750 දරන P පිඹුරට අනුව වෙළුම/පත්‍රුරුව L 18/96 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

03 - 879

---

## සම්පත් බැංකුව පීඑල්සී
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

01. ඩබ්ලිව්. ඒ. ජේ. එච්. එම්. ගුණසේකර.
ගිණුම් අංක : 0165 5000 3434.

02. රන්සෙවන ටයිල් ෆැක්ටරි
ගිණුම් අංක : 0165 1000 4080.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2019.01.31 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් මීගමුව ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන එෆ්. ප්‍රනාන්දුපුල්ලේ යන අය විසින් ලියා සහතික කරන ලද 2013 දෙසැම්බර් මස 10 දාතම හා අංක 18432 දරන සහ කේ. ඒ. ඩී. සුබසිංහ යන අය විසින් ලියා සහතික කරන ලද 2014 අප්‍රේල් මස 09 දාතම හා අංක 1636 දරන උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ "රන්සෙවන ටයිල් ෆැක්ටරි" යන ව්‍යවහාරික නාමය යටතේ කරගෙන යන ව්‍යාපාරයේ හවුල්කරුවන් වන විජේරත්න ආරච්චිගේ ජනන්ද හසරංග මැඩොන්සා ගුණසේකර සහ විජේරත්න ආරච්චිගේ ජූඩ් රොඩ්නි ජයන්ත මැඩොන්සා ගුණසේකර යන අයවලුන් බන්ධනදායීන් වශයෙන් හා එකී විජේරත්න ආරච්චිගේ ජනන්ද හසරංග මැඩොන්සා ගුණසේකර යන අය උකස්කරු වශයෙන් ද පැහැර ඇති හෙයින් ද,

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඒ. ඩී. සුබසිංහ යන අය විසින් ලියා සහතික කරන ලද 2016 ඔක්තෝබර් මස 11 දාතම හා අංක 3730 දරන සහ 2017 මාර්තු මස 27 දාතම හා අංක 4107 දරන උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විජේරත්න ආරච්චිගේ ජනන්ද හසරංග මැඩොන්සා ගුණසේකර යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර ඇති හෙයින් ද,

එකී අංක 18432, 1636. 3730 සහ 4107 දරන බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් එක්කෝටි අසූ එක් ලක්ෂ හතලිස් නම දහස් තුන්සිය දහයයි ශත හතලිස් හයක (රු. 18,149,310.46) මුදලක් 2018 දෙසැම්බර් මස 05 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් එක්කෝටි අසූ එක් ලක්ෂ හතලිස් නම දහස් තුන්සිය දහයයි ශත හතලිස් හයක (රු. 18,149,310.46) මුදල ද, 2018 දෙසැම්බර් මස 06 වැනි දින සිට අංක 18432, 1636, 3730 සහ 4107 දරන එකී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් අසූ ලක්ෂයක (රු. 8,000,000) මුදලක් සඳහා වාර්ෂිකව at the rate of Average Weighted Prime Lending Rate + Four Decimal Five per centum (4.5%) per annum (floor rate of 16.5% ) , රුපියල් අසූ හතර ලක්ෂය දස දහසක (රු. 8,410,000.00) at the rate of Sixteen Decimal Five Per centum (16.5%) per annum බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 18432, 1636, 3730 සහ 4107 දරන උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ, කම්මල් පත්තුවේ, වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ උල්හිටියාව - උතුර, අංක 492 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ උල්හිටියාව ග්‍රාමයේ

පිහිටි "දිවුල්ගහවතු කැබැල්ල" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එස්. එස්. ඒ. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 2010 පෙබරවාරි මස 11 දාතම හා අංක 3005A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : රොඩ්නි ගුණසේකර යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම, නැගෙනහිරට : ෆැසිඩස් පෙරේරා යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බලයලත් මානක තැන වී. එෆ්. වර්ණකුලසූරිය යන අය විසින් සාදන ලද අංක 8163 දරන පිඹුරේ ඉඩම, දකුණට : මේපල්ස් මාවත වඩා නිවැරදිව මේපල්ස් මාවත සහ එකී අංක 8163 දරන පිඹුරේ ඉඩම සහ බස්නාහිරට : කිංස්ලි ගුණසේකර යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකක් (A:0, R:2, P:0) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 3005A දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව G 236/60 යටතේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

03 - 841

---

## මහජන බැංකුව - බම්බලපිටිය ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඇ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018.12.18 වැනි දින පවත්වන ලද ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ.

මහජන බැංකුව වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රියන්ති ලියනගේ විසින් සහතික කරන ලද 2017.08.17 වැනි දින අංක 7558 දරන උකස් බැඳුම්කරය මත සහ 2017.08.17 වැනි දින අංක 7557 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම (පද සම්බන්ධය අනුව මෙහි මින්මතු අර්ත් ටෙක් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනය, එහි අනුප්‍රාප්තිකයන් සහ පැවරුම්ලාභින් අවශ්‍ය වන, අදහස් වන සහ ඇතුළත් වන මෙහි මින්මතු "බන්ධනදායී සමාගම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 02 1/1, පෙන්ට්‍රයිව් ගාඩ්න්, කොළඹ 03 යන ලිපිනයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තා වූ ද අංක PV 116793 යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වන අර්ත් ටෙක් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සහ (මෙහි මින්මතු "උකස් බැඳුම්කාර" තම්බයියා තාමශ්‍රී යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 23, 5/1, සාගර පාර, බම්බලපිටිය, කොළඹ 04 යන ලිපිනයේ පදිංචි තම්බයියා තාමශ්‍රී යන අය විසින් පැහැර ඇති හෙයින් ද, එකී අංක 7558 සහ 7557 දරන උකස් බැඳුම්කර මත දැනට මහජන බැංකුව වෙත රුපියල් මිලියන එකොළහයි හාරලක්ෂ පනස් දෙදහස් හාරසිය අනූතුනයි ශත අනූ හතරක් වූ මුදලක් (රු. 11,452,493.94) ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින හෙයින් ද, අනතුරුව කිසියම් ගෙවීමක් (සිදුකර ඇත්නම්) එම ගෙවීම අඩු කිරීමෙන් පසුව විකුණුම් පිරිවැය සහ වෙනත් ගාස්තු ද සමග 2018.11.08 වැනි දින සිට වෙන්දේසි දිනයතෙක් වර්ෂයකට 17%ක් වූ පොළී මුදලක් ද සමග රුපියල් මිලියන පහයි ලක්ෂ පහක් වූ මුදලක් ද (රු. 5,500,000.00) 2018.11.06 වැනි දින සිට වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට 18.5% ක් වූ පොළී මුදලක් ද සමග රුපියල් මිලියන පහක් වූ මුදලක් ද (රු. 5,000,000.00) අයකර ගැනීම සඳහා ඉහත කී උකස් බඳුම්කර මගින් ඉහත කී බැංකුව වෙත උකස් කරන ලද දේපළ සහ පරිශ්‍රය කොළඹ, බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක මහතත්මිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහනගර සභා සීමාව ඇතුළත, හැව්ලොක් ටවුන් 42 කොට්ඨාසයේ, බම්බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ බම්බලපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සාගර පාර, වර්තමානයේ වරිපනම් අංක 21 සහ 23 දරන සහ බලයලත් මිනින්දෝරු එස්. ක්‍රිෂ්ණපිල්ලෙයි විසින් සාදන ලද 2006.07.12 වැනි දින අංක 2093A දරන පිඹුරේ නිරූපිත ලොට් Y3 ලෙස ලකුණු කරන ලද, උතුරට : ලොට් Y1 සහ Y2 ද, නැගෙනහිරට : වරිපනම් අංක 19, සාගර පාර ද, දකුණට : කාසල් පටුමග, වරිපනම් අංක 14, 16, 18 සහ 20 ද, බටහිරට : සාගර පාර, වරිපනම් අංක G27 ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ E52/116 දරන හිමිකම් යටතේ ලියාපදිංචි වී ඇති ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහ අටයි දශම අටයි පහක් (අ. 0, රූ. 1, පර්. 18.85) හෙවත් හෙක්ටයාර් 0.148848 හෙවත් වර්ග මීටර් 1488.48 ක් වූ ලොට් Y3 නමැති ඉහත කී බෙදා වෙන් කළ ඉඩම් කොටස වේ.

ඉහත කී බම්බලපිටිය සාගර පාර ඔස්සේ පිහිටා ඇත්තා වූ ද වරිපනම් අංක 23, 5/1, සාගර පාර, බම්බලපිටිය දරන සහ බලයලත් මිනින්දෝරු එස්. ක්‍රිෂ්ණපිල්ලෙයි විසින් සාදන ලද 2014.06.20 දින අංක 3495 දරන සහාධිපත්‍ය පිඹුරේ නිරූපිත පස්වන මහලේ ඒකක අංක F5P1 දරන සහ ප්‍රමාණයෙන් වර්ග මීටර් අනූඅටයි දශම හතරයි අටක් (ව. මී. 98.48) හෙවත් වර්ග අඩි එක් දහස් හැටක් වූ ද (ව.අඩි 1060), උතුරට : මෙම සහාධිත්‍ය දේපළ කොටස සහ CE54, CE19

(විදුලි සෝපානය) සහ CE32 අතර පිහිටි බිත්තියේ මධ්‍යකය ද , නැගෙනහිරට : මෙම සහාධිපත්‍ය දේපළ කොටස සහ CE19 (විදුලි සෝපානය) CE32, CE23 සහ CE3 අතර පිහිටි බිත්තියේ මධ්‍යකය, දකුණට : මෙම සහාධිපත්‍ය දේපළ කොටස සහ CE3 අතර පිහිටි බිත්තියේ මධ්‍යකය ද, බටහිරට : මෙම සහාධිපත්‍ය දේපළ කොටස, CE3, CE18 (ගිණි SW), CE19 සහ CE32 අතර පිහිටි බිත්තියේ මධ්‍යකය ද, CPF 4PI මුදුනට ඉහළ මෙම සහාධිපත්‍ය කොටසේ කොන්ක්‍රීට් බිමෙහි මධ්‍යකය, F6P1 දරන සහාධිපත්‍ය කොටස ඉහළ කොන්ක්‍රීට් බිමෙහි මධ්‍යකය ද යන මායිම් තුළ පිහිටි සහාධිපත්‍ය F 63/116 දරන හිමිකම යටතේ කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි වී ඇති පදිංචි නිවාස ඒකකය වේ.

**බිම් මහල**
- ඉදිරිපස සහ පසුපස විවෘත ප්‍රදේශ, වම් පස සීමා තාප්පයට යාබද ප්‍රදේශ
- මෝටර් රථ විදුලි සෝපානය, රිය පැදවුම් මාර්ගය;
- පොම්පාගාරය, විද්‍යුත් කාමරය සහ ජෙනරේටර් කාමරය;
- තරප්පු පෙළ, සෝපානය, අශක්නුනා සහිත තැනැත්තන්ගේ වැසිකිළි, සේවා යුගයන්;

**ආකෘතික බිම**
- තරප් පෙලවල් සහ ආලින්ද, ප්‍රධාන ස්තෝප්පුව, සේවා යුගයන්;
- විවෘත අවකාශ (ගෙමිදුල හෝ අලෝක බිත්ති);

**අටවන මහල**
- තරප්පු පෙළවල් සහ ආලින්ද, ප්‍රධාන ස්තෝප්පුව, සේවා යුගයන්;
- වහල ටෙරසය, සේවා යුගයන්
- විවෘත අවකාශ (ගෙමිදුල හෝ අලෝක බිත්ති)

**වහල මුදුන**
- ජිම්නාස්ටික් ක්‍රීඩාගාරය, කාන්තා සහ පුරුෂ වැසිකිළි, වහල ස්තෝප්පුව;
- පිහිනුම් තටාකය, (පිහිනුම් තටාක උපාංග තරප්පු පෙළ, පිහිනුම් තටාකයට යටින් ඇති අවකාශය, තටාක සැලසුම් කාමරය සහ තුලන ටැංකිය) ;
- විදුලි සෝපානය සහ විදුලි සෝපාන ආලින්ද, තරප්පු පෙළවල් සහ තරප්පු පෙළ ආලින්ද ;
- විදුලි සෝපාන යන්ත්‍ර කාමරය සහ ජල ටැංකිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මහජන බැංකු ප්‍රාදේශීය කළමනාකරු
(කොළඹ දකුණ).

කලාප ප්‍රධාන කාර්යාලය - (බස්නාහිර කලාපය - 01),
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

03 - 819

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - තංගල්ල ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතියයි

විලා තංගල්ල බීච් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2019 ජනවාරි මස 24 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ප්‍රසිද්ධ නොතාරිස් ආර්. පී. කේ. රාජපක්ෂ විසින් 2016.07.01 වැනි දින සහතික කළ අංක 128 දරන උකස් බැඳුම්කරය මගින් විලා තංගල්ල බීච් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් හා යාපා අප්පුහාමිලාගේ නයන උදයප්‍රිය කුමාර උකස්කරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී.එල්. සී. වෙතින් ලබා ගත් ණය මුදල් සඳහා සුරැකුම් වශයෙන් මෙහි පහත පළමු උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති දේපළ විලා තංගල්ල බීච් (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා ප්‍රදානය කරන ලද ණය මුදල් වෙනුවෙන් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇති හෙයින් සහ 2018.09.30 වැනි දින වන විට රුපියල් මිලියන දහයයි දෙලක්ෂ තිස් අටදහස් එකසිය හතලිස් හතයි ශත අනූ පහක්වූ (රු. 10,238,147.95) අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ප්‍රසිද්ධ නොතාරිස් ආර්. පී. කේ. රාජපක්ෂ විසින් 2016.10.14 වැනි දින සහතික කළ අංක 157 දරන උකස් බැඳුම්කරය මගින් විලා තංගල්ල බීච් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් හා යාපා අප්පුහාමිලාගේ නයන උදයප්‍රිය කුමාර උකස්කරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී.එල්. සී. වෙතින් ලබා ගත් ණය මුදල් සඳහා සුරැකුම් වශයෙන් මෙහි පහත දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති දේපළ විලා තංගල්ල බීච් (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා ප්‍රදානය කරන ලද ණය මුදල් වෙනුවෙන් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇති හෙයින් සහ 2018.09.30 දින වන විට රුපියල් මිලියන හතයි නව ලක්ෂ අනූ නවදහස් පනස් හතයි ශත තිස් දෙකක් වූ (රු. 7,999,057.32) අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී යාපා අප්පුහාමිලාගේ නයන උදයප්‍රිය කුමාර යන අය ඉහත කී විලා තංගල්ල බීච් (ප්‍රයිවට්) ලිමිටඩ් හි අත්‍ය අයිතිකරු හා පාලනය දරන තැනැත්තා වන අතර එමෙන්ම ඉහත කී යාපා අප්පුහාමිලාගේ නයන උදයප්‍රිය කුමාර එකී සමාගමේ, පාලනය හා කළමනාකරණය දරන හෙයින් ඒ අනුව ඉහත කී යාපා අප්පුහාමිලාගේ නයන උදයප්‍රිය කුමාර යන අය හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. විසින් විලා තංගල්ල බීච් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත සැපයූ මූල්‍ය පහසුකමේ නියම අර්ථලාභියා වන හෙයින් ද,

විලා තංගල්ල බීච් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ යාපා අප්පුහාමිලාගේ නයන උදයප්‍රිය කුමාර යන අය හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර ඇති හෙයින් ද, 2018.09.30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත රුපියල් මිලියන දහඅටයි දෙලක්ෂ තිස් හත්දහස් දෙසිය පහයි ශත විසිහතක (රු. 18,237,205.27) මුලු මුදලක් එකී බැඳුම්කර යටතේ අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්ද එකී රු. 18,237,205.27ක මුදල අයකර ගැනීම සඳහා සහ 2018 ඔක්තෝබර් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද සමග ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා එකී අංක 128 සහ 157 දරන බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇති මෙහි පහත පළමු සහ දෙවන උපලේඛනයන්හි සවිස්තරව විස්තර කොට ඇති දේපළ මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### පළමු උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවා පත්තුවේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ නගර සභා සීමාවේ මැදකැටිය ගමේ අශෝක මාවත හි පිහිටි කල්දේරමවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. සිරිබද්දන විසින් 2001 අප්‍රේල් මස 08 වැනි දින පිළියෙල කරන ලද අංක 1780 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් ඒ වශයෙන් දක්වන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : අංක 1169 දරන පිඹුරේ දැක්වෙන ලද ලොට් 5 මගින් ද (අශෝක මාවතේ සිට පටන් ගන්නා අඩි 10 පළල පාර), නැගෙනහිරට : අංක 1780 දරන පිඹුරේ දක්වන ලද ලොට් බී මගින් ද, දකුණට : අංක 1780 දරන පිඹුරේ දක්වන ලද ලොට් බී මගින් ද සහ බස්නාහිරට : අංක 1568 දරන පිඹුරේ දක්වන ලද ලොට් 3ඒ මගින් ද මායිම් වූ එකී අංක 1780 දරන පිඹුර ප්‍රකාරව පර්චස් පහළොවක (අ.0, රූ.0, පර්.15) විශාලත්වයෙන් වූ ඉඩම වේ.

### දෙවන උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවා පත්තුවේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ නගර සභා සීමාවේ අංක 263, මැදකැටිය ග්‍රාම නිලධාරි වසමේ මැදකැටිය ගමේ මෝදර පාර, කොට්ඨාස අංක 5හි පිහිටි කලපුවගාවවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. සිරිබද්දන විසින් 2014 අගෝස්තු මස 01 වැනි දින පිළියෙල කරන ලද අංක 6061 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් ඒ2 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : අංක 6061 දරන පිඹුරේ දක්වන ලද ලොට් ඒ1 මගින් ද, නැගෙනහිරට : මුහුදු වෙරළ මගින් ද, දකුණට : මුහුදු වෙරළ මගින් ද, බස්නාහිරට : කලපුව මගින් ද මායිම් වූ එකී අංක 6061 දරන පිඹුර ප්‍රකාරව පර්චස් නවයයි දශම තුනක (අ. 0, රූ. 0, පර්. 9.3) විශාලත්වයෙන් වූ ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර.
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
මාණ්ඩලික ලේකම්.

03 - 849/1

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - නොච්චියාගම ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතියයි

ලියන ආරච්චිලාගේ ජයන්තා දමයන්ති ලියනගේ.

2019 ජනවාරි 24 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් යූ. විජේරත්න විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ ද 2016.08.04 වැනි දින සහතික කළ අංක 2945 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලියන ආරච්චිලාගේ ජයන්තා දමයන්ති ලියනගේ ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ නිවාස ණය පහසුකම මත රුපියල් මිලියන දොළහයි නව ලක්ෂ විසි දෙදහස් හාරසිය විසි හතයි ශත හැත්තෑ දෙකක (රු. 12,922,427.72) මුදලක් පමණක් 2018 ඔක්තෝබර් මස 31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රු. 12,922,427.72ක මුදල අයකර ගැනීම සඳහා සහ 2018 නොවැම්බර් මස 1 වැනි දින සිට දේපළ විකිණීමේ දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 2945 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ

වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාත, නැගෙනහිර කනදර කෝරළේ, අනුරාධපුර මහ නගර සභා සීමා ඇතුළත අනුරාධපුර නගරයේ අදියර II තුළ පිහිටි "කුම්බිච්චන්කුලම කැළේ" නමැති ඉඩමට 1986.09.05 වැනි දින සර්වයර් ජෙනරාල් විසින් සහතික කළ අවසාන නාගරික සැලැස්ම ඒ3 තුළ පිටු අංක 101හි බෙදා වෙන් කරන ලද ලොට් 660 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ලොට් 659 න් ද, නැගෙනහිරට : ලොට් 651 සහ 652 න් ද, දකුණට : ලොට් 661 න් ද, බස්නාහිරට : ලොට් 701 න් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් තිස් පහයි දශම තුනයි හයක (අ. 0, රූ. 0, පර්. 35.36) විශාලත්වයයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලුදේත් සමග වේ.

වඩා මෑත මිනුමකට අනුව ඉහත ඉඩම පහත පරිදි විස්තර වේ.

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කනදර කෝරළේ, නුවරගම් පළාත නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අනුරාධපුර නාගරික සභා සීමා ඇතුළත (වර්තමානයේ අනුරාධපුර මහ නගර සභාවේ) අංක 251 දරන ග්‍රාම නිලධාරි වසමේ අනුරාධපුර නව නගරයේ අදියර II තුළ පිහිටි අවසාන නාගරික සැලැස්ම ඒ3 තුළ ලොට් 660 වන "කුම්බිච්චන්කුලම කැළේ" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. බී. රත්නසිරි විසින් 1997.07.22 වැනි දින පිළියෙල කළ අංක 079 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : එෆ්. යූ. පී. ඒ3 තුළ ලොට් 659 න් ද, නැගෙනහිරට : එෆ්. යූ. පී. ඒ3 තුළ ලොට් 651 සහ 652 න් ද, දකුණට : එෆ්. යූ. පී. ඒ3 තුළ ලොට් 661 න් ද, බස්නාහිරට : එෆ්. යූ. පී. ඒ3 තුළ ලොට් 701 න් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් තිස් පහයි දශම තුනයි හයක (අ. 0, රූ. 0, පර්. 35.36) හෙවත් හෙක්ටයාර් බින්දුවයි දශම බින්දුවයි අටයි නවයයි හතරක (හෙක්ටයාර් 0.0894) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලුදේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර.
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

03 - 849/2

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - බොරලැස්ගමුව ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතියයි

කුරුවිටගේ සුමින්ද පෙරේරා.

2019 ජනවාරි මස 24 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එම්. පී. පී. එන්. මහිපාල විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2017 අගෝස්තු මස 30 වැනි දින සහතික කළ අංක 1328 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම කුරුවිටගේ සුමින්ද පෙරේරා ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් ද එකී බැඳුම්කරය යටතේ රුපියල් මිලියන නවයයි අට ලක්ෂ තිස් තුන් දහස් තුන්සිය හතළිහයි ශත එකොළහක (රු. 9,833,340.11) මුදලක් පමණක් 2018 නොවැම්බර් මස 23 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී (රු. 9,833,340.11) මුදල අයකර ගැනීම සඳහා සහ 2018 නොවැම්බර් මස 24 වැනි දින සිට දේපළ විකිණීමේ දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 1328 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තාවූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, 580 - කැලියම්මහර ග්‍රාම නිලධාරි වසමේ සහ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇතුළත කැස්බෑව නගර සභා සීමා ඇතුළත කැස්බෑව කැලියම්මහර පිහිටි "මීගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. රෝහණ එස්. පෙරේරා විසින් 2016.10.07 වැනි දින පිළියෙල කරන ලද අංක 6951 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 4 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : අංක 658

දරන පිඹුරේ ලොට් එම් මගින් ද, නැගෙනහිරට : අංක 3397 දරන පිමුරේ ලොට් එන් 2 මගින් ද, දකුණට : ලොට් 5 ම ගින් ද සහ බස්නාහිරට : ලොට් 2 සහ 3 මගින් ද මායිම් වූ එකී අංක 6951 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහයයි දශම එකයි හයක (අ. 0, රූ. 0, පර්. 10.16) හෙවත් හෙක්ටයාර් 0.0257ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලදේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර.
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

03 - 849/3

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - මොරටුව ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතියයි

පැරඩයිස් ලංකා මාකටින් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
අධ්‍යක්ෂක - බෝවිතන්ත්‍රි චමිලා මනෝහාරි.

2019 ජනවාරි 24 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් 2014.06.05 වැනි දින සහතික කළ අංක 4524, 2016.10.19 වැනි දින සහතික කළ අංක 5407 සහ 2018.07.26 වැනි දින සහතික කළ අංක 6030 දරන බැඳුම්කරයන් මගින් පැරඩයිස් ලංකා මාකටින් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් හා බෝවිතන්ත්‍රි චමිලා මනෝහාරි උකස්කරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබා ගත් ණය මුදල් සඳහා සුරැකුම් වශයෙන් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති දේපළ පැරඩයිස් ලංකා මාකටින් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා ප්‍රදානය කරන ලද ණය මුදල් වෙනුවෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇති හෙයින් ද,

ඉහත කී බෝවිතන්ත්‍රි චමිලා මනෝහාරි යන අය ඉහත කී පැරඩයිස් ලංකා මාකටින් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි අත්‍යා අයිතිකරු හා පාලනය දරන තැනැත්තා වන අතර එමෙන්ම බෝවිතන්ත්‍රි චමිලා මනෝහාරි එකී සමාගමේ, පාලනය හා කළමනාකරණය දරන හෙයින් ඒ අනුව ඉහත කී බෝවිතන්ත්‍රි චමිලා මනෝහාරි යන අය හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් පැරඩයිස් ලංකා මාකටින් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත සැපයූ මූල්‍ය පහසුකමේ නියම ආර්ථලාභියා වන හෙයින් ද,

පැරඩයිස් ලංකා මාකටින් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ බෝවිතන්ත්‍රි චමිලා මනෝහාරි යන අය හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත අයවිය යුතු මුදල ගෙවීම පැහැර ඇති හෙයින් ද 2018.11.08 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත රුපියල් මිලියන පහයි හාර ලක්ෂ හැත්තෑ එක්දහස් හාරසිය අසූ හයයි ශත දෙකක (රු. 5,471,486.02) මුදලක් පමණක් එකී බැඳුම්කරයන් යටතේ අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 5,471,486.02ක මුදල අයකර ගැනීම සඳහා සහ 2018.11.09 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද සමග ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 4524, 5407 සහ 6030 දරන බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇති දේපළ මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු ඩලස් කෙලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්දේ, පානදුර ප්‍රාදේශීය සභාවේ, කෙසෙල්වත්ත උප කාර්යාල සීමා ඇතුළත සහ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 672ඒ - පරත්ත ග්‍රාම නිලධාරි වසමේ, පරත්ත සහ කෙසෙල්වත්ත, පරත්ත පාර, 134/1 හි පිහිටි දොලේවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ආර්. කුමාරගේ විසින් 1998 දෙසැම්බර් 16 වැනි දින පිළියෙල කරන ලද අංක 666 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 19ඩී වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : එම්. ආර්. ප්‍රනාන්දුගේ ඉඩමෙන් ද, නැගෙනහිරට : එකී අංක 666 දරන පිඹුරේ ලොට් 19සී මගින් ද, දකුණට : එකී අංක 666 දරන පිඹුරේ ලොට් 19ඒ (අඩි 10 පළල පාර සඳහා වෙන්කිරීම) මගින් ද සහ බස්නාහිරට : එකී අංක 666 දරන පිඹුරේ ලොට් 19ඊ මගින් ද මායිම් වූ එකී අංක 666 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහයක (අ. 0, රූ. 0, පර්.10) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුදේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර.
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

03 - 849/4

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - පැල්මඩුල්ල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතියයි

අර්සකුලසූරිය පර්සි රූපසිංහ.

2019 ජනවාරි 24 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. සී. ආර්. ඩී. රාජපක්ෂ විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2016.04.08 වැනි දින සහතික කළ අංක 3648 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම අර්සකුලසූරිය පර්සි රූපසිංහ ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ වෙනත් පහසුකම් අතර වාර ණය පහසුකමක් මත රු. 5,219,218.36 (රුපියල් පනස් දෙලක්ෂ දහනව දහස් දෙසිය දහ අටයි ශත තිස් හයක) මුදලක් 2018 සැප්තැම්බර් 30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රු. 5,219,218.36ක මුදල අය කර ගැනීම සඳහා සහ 2018 ඔක්තෝබර් 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද, තදානන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 3648 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස්කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ජේ. ඩබ්. ඊ. ජයවර්ධන ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

#### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, නවදුන් කෝරළේ, උඩ පත්තුවේ, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා සීමා ඇතුළත, පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පාතකඩ ග්‍රාම නිලධාරී වසමේ, දෙනවන පාතකඩ ගමේ පිහිටි "බතලවත්ත" ලෙස හඳුන්වන සහ නැමති ඉඩමට එම්. එස්. දියගම එල් : එස් විසින් 1991.08.27 වැනි දින නමුත් වඩාත් නිවැරදිව 1991.08.29 වැනි දින පිළියෙල කරන ලද අංක 2420 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : කනත්තේවත්ත මැදවත්ත මගින් ද, නැගෙනහිරට : එල්. එම්. ඒ. කුසුමාවතීට අයිතිවන බතලවත්ත මගින් ද, දකුණට : රත්නපුර - පැල්මඩුල්ල ප්‍රධාන පාර මගින් ද සහ බස්නාහිරට : ලොට් 2 මගින් ද මායිම් වූ එකී අංක 2420 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසිඅටක (අ. 0, රූ. 0, පර්. 28) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුදේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර.
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

03 - 849/5

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - මොරටුව ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතියයි

පැරඩයිස් ලංකා මාකටින් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
අධ්‍යක්ෂක - නානායක්කාර වසන් කරිග්ගවත්තගේ සෙනරත් ජයසූරිය.

2019 ජනවාරි 24 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් 2018.07.26 වැනි දින සහතික කළ අංක 6031 දරන බැඳුම්කරය මගින් පැරඩයිස් ලංකා මාකටින් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් හා නානායක්කාර වසන් කරිග්ගවත්තගේ සෙනරත් ජයසූරිය උකස්කරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබා ගත් ණය මුදල් සඳහා සුරැකුම් වශයෙන් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති දේපළ පැරඩයිස් ලංකා මාකටින් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා ප්‍රදානය කරන ලද ණය මුදල් වෙනුවෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇති හෙයින් ද,

ඉහත කී නානායක්කාර වසන් කරිග්ගවත්තගේ සෙනරත් ජයසූරිය යන අය ඉහත කී පැරඩයිස් ලංකා මාකටින් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි අත්‍යය අයිතිකරු හා පාලනය දරන තැනැත්තා වන අතර එමෙන්ම නානායක්කාර වසන් කරිග්ගවත්තගේ සෙනරත් ජයසූරිය එකී සමාගමේ, පාලනය හා කළමනාකරණය දරන හෙයින් ඒ අනුව ඉහත කී නානායක්කාර වසන් කරිග්ගවත්තගේ සෙනරත් ජයසූරිය යන අය හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් පැරඩයිස් ලංකා මාකටින් සර්විස්

(ප්‍රයිවට්) ලිමිටඩ් වෙත සැපයූ මූල්‍ය පහසුකමේ නියම ආර්ථලාභියා වන හෙයින් ද,

පැරඩයිස් ලංකා මාකටින් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ නානායක්කාර වසන් කරිග්ගවත්තගේ සෙනරත් ජයසූරිය යන අය හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත අයවිය යුතු මුදල ගෙවීම පැහැර ඇති හෙයින් ද 2018.11.08 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත රුපියල් මිලියන දහඅටයි දෙලක්ෂ අසූ නවදහස් එකසියයයි ශත හතලිස් හයක (රු. 18,289,100.46) මුදලක් පමණක් එකී බැඳුම්කරය යටතේ අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 18,289,100.46ක මුදල අයකර ගැනීම සඳහා සහ 2018.11.09 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද සමග ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව, තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 6031 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇති දේපළ මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු ඩලස් කෙලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්දේ, පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහකාර ප්‍රාදේශීය සභාවේ, කෙසෙල්වත්ත උප කාර්යාල සීමා ඇතුළත 672ඩී - පරත්ත බටහිර ග්‍රාම නිලධාරි වසමේ, පරත්තේ පිහිටි නදීබොඩවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ජී. සී. සිරිසෝම විසින් 2007 නොවැම්බර් 17 වැනි දින පිළියෙල කරන ලද අංක 7135 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් ඒ වශයෙන් දැක්වෙන ඉඩම් කෙටසට මායිම් වශයෙන්, උතුරට : අංක 117/1982 දරන පිඹුරේ ලොට් 6 මගින් ද (අඩි 20 පළල පාර), නැගෙනහිරට : පාර (පී. එස්) සහ ජී. ජී. සී. හස්තනාක එල්. එස්. විසින් 1996 පෙබරවාරි 04 වැනි දින පිළියෙල කරන ලද අංක 528 දරන පිඹුරේ ලොට් 1 මගින් ද, දකුණට : අංක 117/1982 දරන පිඹුරේ ලොට්ස් 109, 110 සහ එකී අංක 528 දරන පිඹුරේ ලොට් 1 මගින් ද සහ බස්නාහිරට : එකී අංක 117/1982 දරන පිඹුරේ ලොට්ස් 77 සහ 6 මගින් ද මායිම් වූ එකී අංක 117/1982 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් තිස් පහයි දශම හතරක (අ. 0, රූ. 1, පර්. 35.4) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුදේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර.
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

03 - 849/6

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී (ලියාපදිංචි අංක PQ 118 දරන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018.12.14 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මොහොමඩ් ජාසීන් මොහොමඩ් ඉම්රාන්.

මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය මොහොමඩ් ජාසීන් මොහොමඩ් ඉම්රාන් යන අය විසින් ලබාගත් මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන්, බන්ධනදායි සහ උකස්කරු වශයෙන් ක්‍රියාකරමින් එකී මොහොමඩ් ජාසීන් මොහොමඩ් ඉම්රාන් යන අය විසින් රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා ජයවර්ධන සහතික කරන ලද අංක 05 සහ 2015.08.28 වැනි දින දරන උකස්කරය මගින් කොළඹ 02, යූනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමින් උකස් කොට, ඇපයට තබා ඇති බැවින් ද,

එකී බැඳුම්කරය මගින් ඇප තබන ලද ඉහත කී පහසුකම් මත ආපසු ගෙවීම් එකී මොහොමඩ් ජාසීන් මොහොමඩ් ඉම්රාන් යන අය විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද,

ඒ අනුව, රුපියල් 5,000,000ක අයිරා පහසුකම මත 2018.08.14 වැනි දින වන විට අයවිය යුතු රුපියල් පනස්එක්ලක්ෂ හැටදහස් නවසිය අනූදෙකකුත් ශත හැත්තෑ පහක (රු. 5,160,992.75) මුදල සහ හිඟ මුදල වන රුපියල් පනස්එක්ලක්ෂ විසිපන්දහස් හැත්තෑනවයකුත් ශත පනස්එකක (රු. 5,125,079.51) මුදල මත එකඟ වූ පරිදි 2018.08.15 වැනි දින සිට තවදුරටත් පොළිය ද, තව ද, සම්බන්ධිත ගාස්තු, ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් යම් ගාස්තු ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් (වෙතොත්) එම මුදල අඩු කොට, අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි ත්‍රිවංක සී. සේනානායක මහතා හෝ එල්. බී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහිගස්තලාව ග්‍රාම නිලධාරි වසමේ

ගොරොක්ගහමඩ ගමේ පිහිටි මිනුම්පති විසින් මැන සාදන ලද අංක 620075 දරන කැඩැස්තර පිඹුරේ නිරූපිත හෙක්ටයාර් 0.0475ක් විශාල ඉඩම් කැබැල්ල.

හිමිකම් සහතික අංක : 00330003395

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යුනියන් පෙදෙස,
කොළඹ 02.

03 - 725

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2017.11.30 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එස්. ආර්. ද සිල්වා විසින් සහතික කරන ලද 2010.10.11 දිනැති අංක 3907 දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ආර්. ද සිල්වා විසින් සහතික කරන ලද 2011.07.22 දිනැති අංක 4265 දරන උකස් බැඳුම්කර මත 2017.09.04 වැනි දින තෙක් දින අයිරාව මත මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් පනස්හතර ලක්ෂ හැත්තෑතුන් දහස් හාරසිය විසිහතරයි ශත හැටඅටක (රු. 5,473,424.68) මුදලක් ද රුපියල් ලක්ෂ හතලිහක (රු. 4,000,000.00) මුදල මත වසරකට සියයට දහහත (17%) බැගින් 2017.09.05 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, 2017.09.04 දින තෙක් ණය මත මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් දහතුන්ලක්ෂ නවදහස් පන්සිය හැටතුනයි ශත තිස්හතක (රු. 1,309,563.37) මුදලක්, රුපියල් නවලක්ෂ අනූදහස් නවසිය පනහක (රු. 990,950.00) මුදල මත වසරකට සියයට දහසය (16%) බැගින් 2017.09.05 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, ජා ඇල, උදම්මිට, සිසිල, අංක 174 හි පදිංචි කඩුපිටි ආනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා මහතා සහ පියහන්දි යෂිකා ද සිල්වා මහත්මිය වෙතින් අයවිය යුතුව ඇත.

2. 2010.10.11 දිනැති අංක 3907 දරන උකස් බැඳුම්කරය සහ 2011.07.22 දිනැති අංක 4265 දරන උකස් බැඳුම්කර මත අයිරාව මත අයවිය යුතු රුපියල් පනස්හතර ලක්ෂ හැත්තෑතුන් දහස් හාරසිය විසිහතරයි ශත හැටඅටක (රු. 5,473,424.68) මුදල සහ ණය මත අයවිය යුතු රුපියල් දහතුන්ලක්ෂ නවදහස් පන්සිය හැටතුනයි ශත තිස්හතක (රු. 1,309,563.37) මුදල සමග 2017.09.05 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවතේ, අංක 50/3, ටී ඇන්ඩ් එච් ඔක්ෂන් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, ජාඇල ශාඛාවේ කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දූනගහපත්තුවේ, දිවුල්පිටිය ප්‍රාදේශීය සභා සීමාවේ, පහළ මඩම්පැල්ල ග්‍රාමයේ පිහිටි පීටර්ස් හිල් එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. සී. එස්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1983 සැප්තැම්බර් 2 දිනැති අංක 172/1983 දරන පිඹුර මත බලයලත් මිනින්දෝරු ඉන්ද්‍රතිස්ස කොටඔගේ විසින් සාදන ලද 2006 දෙසැම්බර් 15 දිනැති සහතික සටහන පරිදි ලොට් 1A ලෙස දක්වා සීමා විස්තර කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල, උතුරට : එයිපෙනිස් අප්පුහාමිගේ එම ඉඩමේ ලොට් 9 ද, නැගෙනහිරට : කේ. ඩී. සන්තියාගෝ සහ වෙනත් අයට අයිති ඉඩම ද, දකුණට : මෙම පිඹුරෙහි ලොට් 1B සහ 1C (අඩි 12 පළල පාර) ද, බස්නාහිරට : LRC වෙත පවරා ඇති එම ඉඩමේ කොටස ද මායිම්ව අක්කර එකයි රූඩ් තුනයි පර්චස් තිස්පහක (අ. 1, රූ. 3, පර්. 35) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සහ වැඩෙන ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සමග වේ. මෙය මීගමු ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E1037/215 හි ලියාපදිංචි කර ඇත.

#### දෙවන උපලේඛනය

එකී පහළ මඩම්පැල්ල ග්‍රාමයෙහි පිහිටි පීටර්ස් හිල් එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. සී. එස්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1983 සැප්තැම්බර් 2 දිනැති අංක 172/1983 දරන පිඹුර මත බලයලත් මිනින්දෝරු ඉන්ද්‍රතිස්ස කොටඔගේ විසින් සාදන ලද 2006 දෙසැම්බර් 15 දිනැති උපබෙදීම් සහතික සටහන පරිදි ලොට් 1C (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා විස්තර කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1C, උතුරට : එකී අංක 172/1983 දරන පිඹුරෙහි ලොට් 1A ද, නැගෙනහිරට : එකී අංක 172/1983 දරන පිඹුරෙහි ලොට් 1B ද, දකුණට : එකී අංක 172/1983 දරන පිඹුරෙහි ලොට් 3 (අඩි 12 පළල පාර ද),

බස්නාරට : LRC වෙත පවරා ඇති එම ඉඩමේ කොටස ද මායිම්ව එකී අංක 172/1983 දරන පිඹුරට අනුව පර්චස් දහයක (අ. 0, රූ. 0, පර්. 10) බිම් ප්‍රමාණකින් යුක්ත වන අතර මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E1037/180 හි ලියාපදිංචි කර ඇත.

මේ සමග මෙය එකී අංක 172/1983 දරන පිඹුරෙහි ලොට් 3 (අඩි 12 පළල පාර) දිගට මාර්ග අයිතිය ද ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඊ. එම්. ඕ. කේ. ඒකනායක මිය,
කළමනාකාරිණි.

ලංකා බැංකුව,
ජාඇල අධිශ්‍රේණි ශාඛාව.

03 - 871

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සහ 2000 අංක 54 දරන පනතින් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

කොළඹ 02, චිත්තම්පලම් A ගාර්ඩිනර් මාවත, අංක 65/2A , J. M. C. ජයසේකර මැනේජ්මන්ට් සෙන්ටර් (පුද්ගලික) සමාගමේ ණය වගකීම් වෙනුවෙන් උකස් කරන ලද දෙමටගොඩ, අර්ථසාධක මාවත, අංක 166/32 හි පිහිටි දේපළ

2018 නොවැම්බර් මස 27 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

ප්‍රසිද්ධ නොතාරිස් ජී. ද අල්විස් විසින් සහතික කරන ලද 2007.10.05 දිනැති අංක 2402 දරන උකස් බැඳුම්කරය අනුව කාලීන ණය මත 2018.10.31 දින තෙක් අයවිය යුතු මුල් මුදල හා පොළිය රුපියල් අටකෝටි විසිහතර ලක්ෂ අනූහයදහස් හයසිය හතලිහයි ශත දහ අටක (රු. 82,496,640.18) මුදල සමග රුපියල් තුන්කෝටි විසිහත්ලක්ෂයක (රු. 32,700,000.00) කාලීන ණය මත වසරකට සියයට පහළොවයි දශම හයයි හත (15.67%) බැගින් ගෙවීම නිම කරන දිනය තෙක් ගෙවිය යුතු පොළිය කොළඹ 02, චිත්තම්පලම් A ගාර්ඩිනර් මාවත, අංක 65/2A හි J. M.C. ජයසේකර මැනේජ්මන්ට් සෙන්ටර් (පුද්ගලික) සමාගම වෙතින් අයවිය යුතුව ඇත.

ප්‍රසිද්ධ නොතාරිස් ජී. ද අල්විස් විසින් සහතික කරන ලද 2007.10.05 දිනැති අංක 2402 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් අටකෝටි විසිහතර ලක්ෂ අනූහයදහස් හයසිය හතලිහයි ශත දහඅටක (රු. 82,496,640.18) මුදල සමග 2018.11.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට තවදුරටත් අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පළමු උපලේඛනයේ හා පාරට වෙන් කළ කොටස ලෙස දෙවන උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3හි, ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර එම්. එච්. තුසිත කරුණාරත්න මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, ආයතනික අයකර ගැනීම් අංශයේ ප්‍රධාන කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහනගර සභාවේ දෙමටගොඩ, අංක 29 දරන කොට්ඨාසයෙහි අර්ථසාධක මාවත (කොළොන්නාව පාර), දැනට වරිපනම් අංක 166/32 දරන J. M.C. ජාත්‍යන්තර පාසල් පරිශ්‍රය එහි දැනට ඇති ගොඩනැගිල්ල සමග බලයලත් මිනින්දෝරු ඒ. එෆ්. සමීර් විසින් සාදන ලද 2006.08.24 දිනැති අංක 4092 දරන පිඹුරෙහි ලොට් 5 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල, උතුරට : අර්ථසාධක මාවතෙහි අංක 166/36 දරන පරිශ්‍රය ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එස්. ජෙගතීසන් විසින් සාදන ලද 1956.06.10 දිනැති අංක 190 දරන පිඹුරෙහි ලොට් 1 (පාරකට වෙන් කළ කොටස) ද, දකුණට : අර්ථසාධක මාවතෙහි වරිපනම් අංක 166/29 දරන ලොට් 6 ද, බස්නාහිරට : අභය පෙදෙසෙහි අංක 9, 17 සහ 19 දරන පරිශ්‍රය ද මායිම්ව පර්චස් විසිදෙකයි දශම පහයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 22.50) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ.

එකී ඉඩම පහත විස්තර කර ඇති ඉඩමෙහි නැවත මැනීමකි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහනගර සභාවේ දෙමටගොඩ පිහිටි කොලොන්නාව පාරේ, වරිපනම් අංක 166/32 දරන බලයලත් මිනින්දෝරු එස්. ජෙගතීසන් විසින් සාදන ලද 1956.06.10 දිනැති අංක 190 දරන පිඹුරෙහි ලොට් 5 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ඇතුළත්ව, උතුරට : කොලොන්නාව පාරේ වරිපනම් අංක G 166 (කොටස) දරන පරිශ්‍රය ද, නැගෙනහිරට : ලොට් 1 (අඩි 40 පළල පාරට වෙන් කළ කොටස ද), බස්නාහිරට : අභය පෙදෙසෙහි වරිපනම් අංක 9, 17 සහ 19 දරන පරිශ්‍ර මායිම්ව එකී අංක 190 දරන පිඹුරට අනුව පර්චස් විසිදෙකයි දශම පහයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 22.50) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 475/64හි ලියාපදිංචි කර ඇත.

දෙවන උපලේඛනය

එකී දෙමටගොඩ පිහිටි අංක 190 දරන පිඹුරෙහි ලොට් 1 (අඩි 40 පළල පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා විස්තර කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ලට, උතුරට : කොලොන්නාව පාර ද, නැගෙනහිරට : ලොට් 2A, 3, 4, 7A, 7B, 7C, 7D, 7E, 7F, 7G, 7H, 7K, 7L, 7M සහ 7N ද, දකුණට : පාලිත පෙදෙස වරිපනම් අංක G23 සහ G33 දරන පරිශ්‍ර ද, බස්නාහිරට : ලොට් 5 සහ 6 සහ කොලොන්නාව පාරේ වරිපනම් අංක G 166 (කොටස) දරන පරිශ්‍ර ද මායිම්ව රූඩ් එකයි පර්චස් දහයක (අ. 0, රූ. 1, පර්. 10) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 956/267 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රධාන කළමනාකරු,
(ආයතනික - අයකර ගැනීම්)

ලංකා බැංකුව,
ආයතනික අයකර ගැනීම් ඒකකය,
අංක 4, ලංකා බැංකු මාවත,
කොළඹ 01.

03 - 870

---

සෙලාන් බැංකුව පීඑල්සී - මාතලේ ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනාව

ගිණුම් අංකය : 0380-35302239-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019.01.28 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 4 දරන සංශෝධිත පරිදි බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත.) ප්‍රසිද්ධ නොතාරිස් ජේ. කේ. නවරත්න විසින් සහතික කරන ලද 2015 නොවැම්බර් මස 13 දිනැති ප්‍රාථමික උකස් බැඳුම්කර අංක 1737 සහ ප්‍රසිද්ධ නොතාරිස් ඇන් මෙලනි ඩී ලීමා විසින් සහතික කරන ලද 2017 ජූලි 27 දිනැති අතිරේක උකස් බැඳුම්කර අංක 1612 මත අයවිය යුතු මුදල් ගෙවීම, මාතලේ පදිංචි නාගසූරිය කුමාර පටබැඳිගේ විනෝශා ප්‍රසංගි පෙරේරා යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් රුපියල් හැටහතර ලක්ෂ අසූදෙදහසක් (රු. 6,482,000.00) මුදලක් එකී බැඳුම්කර මත 2018 ඔක්තෝබර් 10 වැනි දින සිට වසරකට සියයට විසි එක (21%) බැගින් පොළිය සමග නැවත ප්‍රතිව්‍යුහගත කරන ලද වාර ණය පහසුකම සම්බන්ධයෙන් රුපියල් හැත්තෑදෙලක්ෂ පනස්හතර දහස් අටසිය හැට හතයි ශත හතලිස්නවයක (රු. 7,254,867.49) මුදලක් 2018 ඔක්තෝබර් මස 09 වැනි දින වන විට මුල් මුදල සහ පොළිය වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙත දැන් ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් හැත්තෑදෙලක්ෂ පනස්හතර දහස් අටසිය හැට හතයි ශත හතලිස් නවයක (රු. 7,254,867.49) මුදල 2018 ඔක්තෝබර් 10 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට පෙරකී පරිදි පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස එකී ප්‍රාථමික උකස් බැඳුම්කර අංක 1737 සහ අතිරේක උකස් බැඳුම්කර අංක 1612 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ හා පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර චන්ද්‍රිමා ගමගේ මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන සංශෝධිත පරිදි බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කය තුළ මාතලේ මහ නගර සභා සීමාව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ මල්වත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පන්නාගම හෙවත් විහාර පාර පිහිටි බලයලත් මිනින්දෝරු ජී. බෝගහපිටිය විසින් සාදන ලද 2013.07.13 දිනැති අංක 4243 සැලැස්මේ නිරූපනය වන ගොරකගහමුල වත්ත සහ කිරාජ්ජගේ වත්ත කොටසක් නමැති සහ හඳුන්වනු ලබන ඉඩමෙන් ලොට් 1 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, ඊසානට : විහාර පාර දැන් වරිපනම් අංක 50/3 දරන කලුවාකට්ටඩියාගේ වත්ත ද, ගිණිකොණට : විහාර පාර, වරිපනම් අංක 50 දරන මෙම ඉඩමේ කොටස ද, නිරිතට : විහාර පාර ද, වයඹට : වරිපනම් අංක 50/3 වඩාත් නිවැරදිව විහාර පාර 50/5 ද යන මායිම් තුළ පර්චස් දහහතරයි දශම දෙකයි පහක් (අ.00, රූ.00, පර්.14.25) විශාල ගොඩනැගිල්ල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැව් මිය,
නීති ප්‍රධානී.

03 - 850

**ලංකා බැංකුව (සංශෝධනය කිරීමේ දැන්වීම)**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2018.11.28 දිනැති දිනමිණ පුවත්පතේ 48 වන පිටුවෙහි පළ කරන ලද අපගේ දැන්වීමෙහි වෙන්දේසිකරුගේ ලිපිනය සහ නම අනවධානය හේතුවෙන් "මහනුවර, ටොරින්ටන් පාරේ, අංක 24 හි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම" ලෙස පළ වී ඇත.

ඒ අනුව වෙන්දේසිකරුගේ ලිපිනය සහ නම "කොලොන්නාව, විහාර මාවත, අංක 50/3, ටී ඇන්ඩ් එච් හි වෙන්දේසිකාර තුසිත් කරුණාරත්න" ලෙස නිවැරදි විය යුතු ය.

ලංකා බැංකුව,
ගිරිඋල්ල.

03 - 872

---

**සෙලාන් බැංකුව පීඑල්සී - ගල්කිස්ස ශාඛාව
2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව.

ගිණුම් අංකය : 0030-01143609-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2019.01.28 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව්9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් දීපානි රංගේ විසින් දෙකම සහතික කරන ලද 2015.02.12 දිනැති උකස් බැඳුම්කර අංක 950, 2016.10.27 දිනැති 1408 සහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්.එස්. ද සිල්වා භාරතිරත්න විසින් සහතික කරන ලද 2017.09.29 දිනැති බැඳුම්කර අංක 1986 මත අයවිය යුතු මුදල් ගෙවීම, රත්මලාන සිය ලියාපදිංචි කාර්යාලය පිහිටුවා ඇති 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගමක් වන කමල් කේබල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ කොළඹ 07 පදිංචි හෂිනි දිලූශා කොඩිතුවක්කු යන අය බන්ධනදායී සහ උකස්කරු වශයෙන් රුපියල් විසිදෙකෝටි පනස්එක්ලක්ෂ හැත්තෑඅටදහස් හයසිය විස්සයි ශත අනූහතරක (රු. 225,178,620.94) ක මුදලක් එකී බැඳුම්කර මත පහත සඳහන් පරිදි පහසුකම් සම්බන්ධයෙන් පොළිය සමග 2018 අගෝස්තු මස 01 වැනි දින වන විට මුල් මුදල සහ පොළිය වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් එකී මුළු මුදල වන රුපියල් විසිදෙකෝටි පනස්එක්ලක්ෂ හැත්තෑඅටදහස් හයසිය විස්සයි ශත අනූහතරක (රු. 225,178,620.94) ක මුදල 2018 අගෝස්තු මස 02 වැනි දින සිට පහත සඳහන් කර ඇති පරිදි පොළිය සමග විකිණීමේ දිනය දක්වා කාලයට ප්‍රසිද්ධ කිරීමේ වියදම් සමග දරන්නට යෙදුන වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස එකී උකස් බැඳුම්කර අංක 950, 1408 සහ 1986 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තා වූ මෙහි සඳහන් උපලේඛන සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන සංශෝධිත පරිදි බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

(අ) වාර ණය I පහසුකම සම්බන්ධයෙන් රුපියල් දෙකෝටි හයලක්ෂයක (රු. 26,000,000.00) මුදලක් 2018 අගෝස්තු මස 02 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වසරකට සියයට දහහතරයි දශම දෙක (14.2%) බැගින් පොළිය සමග 2018 අගෝස්තු මස 01 වැනි දින විට රුපියල් දෙකෝටි හැත්තෑ නව ලක්ෂ නවදහස් පන්සිය දහඅටයි ශත තිස්හයක (රු. 27,909,518.36) මුදලක්,

(ආ) වාර ණය II පහසුකම සම්බන්ධයෙන් රුපියල් එක්කෝටි දහනවලක්ෂ හාරදහස් හත්සිය හැට එකයි ශත අසූහතරක (රු. 11,904,761.84) මුදලක් 2018 අගෝස්තු මස 02 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වසරකට සියයට දහහතරයි දශම දෙක (14.2%) බැගින් පොළිය සමග 2018 අගෝස්තු මස 01 වැනි දින වන විට රුපියල් එක්කෝටි විසිහත්ලක්ෂ හැත්තෑනවදහස් අසූතුනයි ශත හතලිස් දෙකක (රු. 12,779,083.42) මුදලක්,

(ඇ) වාර ණය III පහසුකම සම්බන්ධයෙන් රුපියල් එක්කෝටි දහනවලක්ෂ හාරදහස් හත්සිය හැට එකයි ශත අසූහතරක (රු. 11,904,761.84) මුදලක් 2018 අගෝස්තු මස 02 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වසරකට සියයට දහහතරයි දශම දෙක (14.2%) බැගින් පොළිය සමග 2018 අගෝස්තු මස 01 වැනි දින විට රුපියල් එක්කෝටි විසිහත්ලක්ෂ හැත්තෑනවදහස් අසූතුනයි ශත හතලිස් දෙකක (රු. 12,779,083.42) මුදලක්,

(ඈ) වාර ණය IV පහසුකම සම්බන්ධයෙන් රුපියල් අටකෝටි පනස් හත් ලක්ෂ අසූපන්දාස් අටසිය දහනවයයි ශත තිස්පහක (රු. 85,785,819.35) මුදලක් 2018 අගෝස්තු මස 02 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වසරකට සියයට පහළොව (15%) බැගින් පොලිය සමග 2018 අගෝස්තු මස 01 වැනි දින වන විට රුපියල් නවකෝටි විසිහතර ලක්ෂ දහතුන් දහස් හයසිය පනස්පහයි ශත විසිහතක (රු. 92,413,655.27) මුදලක්.

(ඉ) වාර ණය V පහසුකම සම්බන්ධයෙන් රුපියල් හත්කෝටි තිස්අට ලක්ෂ අසූඅටදහස් දෙසිය පනස් පහයි ශත තිහක (රු. 73,888,255.30) මුදලක් 2018 අගෝස්තු මස 02 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වසරකට සියයට පහළොවක (15%) බැගින් පොළිය සමග 2018 අගෝස්තු මස 01 වැනි දින විට රුපියල් හත්කෝටි අනූදෙලක්ෂ අනූහත්දහස් දෙසිය අසූවයි ශත හතලිස්හතක (රු. 79,297,280.47) මුදලක්,

**ඉහත සඳහන් උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුල, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ සහ කුරුඳුවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ කුරුඳුවත්ත හෝර්ටන් ප්ලේස් දිගේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. ඩී. ලියනසූරිය විසින් සාදන ලද 2003.12.27 දිනැති අංක 7738 දරන සැලැස්මේ නිරූපනය වන ඉඩමේ ලොට් ඒ2 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට්ස් ඒ3 සහ ඒ1 ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් බී ද, දකුණට : විජයරාම මාවත වරිපනම් අංක 91 පරිශ්‍රය සහ බස්නාහිරට : හෝටන් ප්ලේස් වරිපනම් අංක 64 දරන පරිශ්‍රය ද, යන මායිම් තුල එකී අංක 7738 දරන සැලැස්ම අනුව පර්චස් විස්සක් විශාල (අ. 0, රූ. 0, පර්. 20) ක් විශාල, බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේ සමඟ ඉඩම.

පහත විස්තර කරනු ලබන ලොට් ඒ3 උඩින් සහ දිගේ මාර්ග අයිතිය සහ වෙනත් අදාල අයිතීන් සමඟ

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ සහ කුරුඳුවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ කුරුඳුවත්ත හෝර්ටන් ප්ලේස් දිගේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. ඩී. ලියනසූරිය විසින් සාදන ලද 2003.12.27 දිනැති අංක 7738 දරන සැලැස්මේ නිරූපනය වන ඉඩමේ ලොට් ඒ3 (පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : හෝටන් ප්ලේස් සහ ලොට් ඒ1 ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් ඒ1 ද, දකුණට : ලොට්ස් ඒ1 සහ 2ඒ සහ බස්නාහිරට : හෝටන් ප්ලේස් වරිපනම් අංක 64 දරන පරිශ්‍රය ද, යන මායිම් තුළ එකී අංක 7738 දරන සැලැස්ම අනුව පර්චස් පහයි දශම හයයි බිංදුවක් විශාල (අ. 0, රූ. 0, පර්. 5.60) ක් විශාල ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැව් මිය.
නීති ප්‍රධානී.

03 - 851

**සෙලාන් බැංකුව පීඑල්සී - බෙලිඅත්ත ශාඛාව 2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0650-32495389 - 101.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 ජනවාරි මස 28 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව්9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එච්. අයි. දිල්රුක්ෂි මෙය විසින් දෙකම සහතික කරන ලද 2017 ජනවාරි මස 26 දිනැති බැඳුම්කර අංක 1229, 2017 ජනවාරි මස 26 දිනැති බැඳුම්කර අංක 1231 මත අයවිය යුතු මුදල් ගෙවීම, මහනුවර පදිංචි කපිල සපුමල් බණ්ඩාර තෙම්නිමුල්ල යන අය බන්ධනදායී වශයෙන් රුපියල් පන්කෝටි අසූහය ලක්ෂ විසිපන් දහස් තුන්සිය විසි එකයි ශත පනස් දෙකක (රු. 58,625,321.52) මුළු මුදලක්, පොළිය සමග එකී බැඳුම්කර මත පහත සඳහන් පරිදි පහසුකම් සම්බන්ධයෙන් 2018 නොවැම්බර් මස 13 වැනි දින වන විට මුල් මුදල සහ පොළිය වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී මුළු මුදල වන රුපියල් පන්කෝටි අසූහය ලක්ෂ විසිපන් දහස් තුන්සිය විසි එකයි ශත පනස් දෙකක (රු. 58,625,321.52) මුදල 2018 නොවැම්බර් මස 14 වැනි දින සිට, සම්පූර්ණ මුදල අයකර ගන්නා දිනය දක්වා කාලයට පහත සඳහන් පරිදි පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ තදනන්තරව ලැබී අති යම්කිසි මුදලක් (ඇත්නම්) එකී මුදල අඩුකර අයකර ගැනීම පිණිස, එකී බැඳුම්කර අංක 1229 සහ 1231 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන සංශෝධිත පරිදි බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

(අ) 2016 ජනවාරි මස 26 වැනි දින ප්‍රදානය කරන ලද වාර ණය 1 පහසුකම් සම්බන්ධයෙන් රුපියල් අනූපන් ලක්ෂ

හතළිස්දහස් නවසිය හතළිස් දෙකයි ශත දහ හතරක (රු. 9,540,942.14) මුදලක් 2018 නොවැම්බර් මස 14 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වසරකට සියයට දහනවය (19%) බැගින් පොළිය සමග 2018 නොවැම්බර් මස 13 වැනි දින වන විට රුපියල් අනූ අට ලක්ෂ පනස් හතර දහස් එකසීයයි ශත හතළිස් නවයක (රු. 9,854,100.49) මුදලක්.

(ආ) 2017 ජනවාරි මස 26 වැනි දින ප්‍රදානය කරන ලද වාර ණය 11 පහසුකම සම්බන්ධයෙන් රුපියල් හාර කෝටි හැත්තෑ හත් ලක්ෂ හාර දහස් හත්සිය දහයයි ශත හැට නවයක (රු. 47,704,710.69) මුදලක් 2018 නොවැම්බර් මස 14 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වසරකට සියයට දහනවය (19%) බැගින් පොළිය සමග 2018 නොවැම්බර් මස 13 වැනි දින වන විට රුපියල් හාර කෝටි අසූ හත් ලක්ෂ හැත්තෑ එක් දහස් දෙසිය විසි එකයි ශත තුනක (රු. 48,771,221.03) මුදලක්.

### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ කිනිගොඩ කෝරළේ, දෙයාල දහමුන පත්තුවේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ හිරිවඩුන්න ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ අන්දිරිමඩ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ආර්. අබේකෝන් විසින් සාදන ලද 2016.04.27 දිනැති අංක 1470/බී දරන අතුරු බෙදූ සැලැස්මේ නිරූපනය වන දොරකුඹුරේලන්ද කහටගහමුල්ලේහේන, දෙමංහන්දිය, හන්කුඹලන්ගහමුල්ලේහේන, මාදංගහමුල්ල ආරච්චිගේ හේන, ඕවටල හෙවත් තුඩුවහේන, දොරකුඹුරේලන්ද හේන, දොරකුඹුරේලන්ද හේන, අඹගහමුල්ලේ හේන, දොරලන්දේ පඹුරුගහමුල්ලේ හේන, මිරිස්වැල්ගොල්ලේ කෝන්ගහමුල්ලේහේන, මූනමල්ගහවත්ත, ලිඳපල්කඩහේන මඩිත්ත හෙවත් ලිඳපල්කඩවත්ත, කංකුඹලන්ගහමුලහේන, කැටකාලාගහමුල හෙවත් කහටගහමුල්ලේහේන දැන් බංගලාවත්ත නමින් එක් දේපළක් ලෙස හඳුන්වනු ලබන ඉඩමේ ලොට් 1ඒ ලකුණු කළ, සම්පූර්ණ බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සම බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : හිරිවඩුන්න සිට පොල්ගහවෙලට යන පාර සහ කිරිනේරිස් විසින් හිමිකම් කියනු ලබන දිවුල්ගහමුල වත්ත ද, ඊසානට : මා ඔයට වෙන්කළ ඉඩම, ගිණිකොණට : අංක 1470 සැලැස්මේ සඳහන් ලොට් අංක 1බී සහ නිරිතට : ආර්. ඩී. දාවිත් විසින් හිමිකම් කියනු ලබන ලිඳපල්කඩවත්ත ජයසුන්දර විසින් හිමිකම් කියනු ලබන බෙලිගහමුලහේන, පොඩිනේරිස් විසින් හිමිකම් කියනු ලබන මූනමල්ගහහේන සහ කිරිබණ්ඩා විසින් හිමිකම් කියනු ලබන ගම්පහේවත්ත ද, යන මායිම් තුළ එකී අංක 1470/බී දරන සැලැස්ම අනුව අක්කර පහයි රූඩ් එකයි පර්චස් තිස්හතයි දශම පහයි බිංදුවක් (අ. 5, රූ. 1, පර්. 37.50) සහ හෙක්ටයාර් 2.2191කට සමාන ඉඩම.

බලයලත් මිනින්දෝරු ඩී. ආර්. අබේකෝන් විසින් සාදන ලද 2016.04.27 දිනැති අංක 1470/බී දරන එකී සැලැස්මේ සඳහන් ලොට් අංක 1සී උඩින් සහ දිගේ සියලු මාර්ග අයිතීන් සමග.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැච් මිය.
නීති ප්‍රධානී.

03 - 852

### සෙලාන් බැංකුව පීඑල්සී - කොච්චිකඩේ ශාඛාව 2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

ගිණුම් අංකය : 0580-12704226-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019.01.28 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 4 දරන සංශෝධිත පරිදි බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව්9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඊ. එස්. පී. ගුණතුංග මෙය විසින් සියල්ල සහතික කරන ලද සහ සියල්ල 2016.11.28 දිනැති උකස් බැඳුම්කර අංක 13, 14 සහ 15 සහ ප්‍රසිද්ධ නොතාරිස් කේ. සී. කොඩිතුවක්කු මිය විසින් සියල්ල සහතික කරන ලද සහ සියල්ල 2018.06.06 දිනැති උකස් බැඳුම්කර අංක 166, 167 සහ 168 මත අයවිය යුතු මුදල් ගෙවීම දළුවාකොටුව ලියාපදිංචි අංක පීවී 90028 දරන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන මහේෂ් කෝපරේෂන් (පීවීටී) ලිමිටඩ්, සියල්ලෝම කොච්චිකඩේ පදිංචි වැවලගේ මයිකල් මහේෂ් ප්‍රනාන්දු, වැවලගේ ජෝර්ජ් හෙන්රි ෆිලිප් ප්‍රනාන්දු හෙවත් වැවලගේ ජෝජ් ප්‍රනාන්දු සහ වර්ණකුලසූරිය මේරි අයිරාංගනී මල්ලිකා ප්‍රනාන්දු යන අය බන්ධනදායීන්/උකස්කරුවන් වශයෙන් රුපියල් දාහත්කෝටි දස ලක්ෂ අනූපන් දහස් හයසිය අනූතුනයි ශත හැත්තෑ අටක (රු. 171,095,693.78) මුදලක් එකී බැඳුම්කර මත පහත සඳහන් පරිදි පහසුකම් මත පොළිය සමග 2018 ඔක්තෝබර් මස 30 වැනි දින වන විට මුල් මුදල සහ පොළිය වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් එකී මුදල වන රුපියල් දාහත්කෝටි දසලක්ෂ අනූපන් දහස් හයසිය අනූතුනයි ශත හැත්තෑ අටක (රු.171,095,693.78) 2018 ඔක්තෝබර් මස 31 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට පහත සඳහන් පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ යම්කිසි වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස එකී බැඳුම්කර අංක 13, 14, 15, 166, 167 සහ 168 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි සඳහන් උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර චන්දිමා ගමගේ මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන සංශෝධිත පරිදි බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

(අ) කාලීන ණය පහසුකම I පහසුකම සම්බන්ධයෙන් රුපියල් දහතුන් කෝටි හැට දෙලක්ෂ අසූ අට දහස් හත්සිය අනූ දෙකයි ශත දහඅටක (රු. 136,288,792.18) මුදලක් මුල් මුදල සම්පූර්ණයෙන් අයකර ගන්නා තෙක් 2018 ඔක්තෝබර් මස 31 වැනි දින සිට වසරකට සියයට සහ නවය (19%) බැගින් පොළිය සමග, රුපියල් දහ හතර කෝටි පහළොස් ලක්ෂ තිස් නව දහස් හයසිය අනූතුනයි ශත හැත්තෑ අටක මුදලක් (රු. 141,539,693.78).

(ආ) කාලීන ණය පහසුකම III පහසුකම සම්බන්ධයෙන් රුපියල් දෙකෝටි අසූ පන් ලක්ෂයක (රු. 28,500,000) මුදලක් මුල් මුදල සම්පූර්ණයෙන් අයකර ගන්නා තෙක් 2018 ඔක්තෝබර් මස 31 වැනි දින සිට වසරකට සියයට විස්ස (20%) බැගින් පොළිය සමග රුපියල් දෙකෝටි අනූ පන් ලක්ෂ පනස් හය දහසක මුදලක් (රු. 2 29,556,000).

## උපලේඛනය

### පළමුවෙනි උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ සහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ සහ අක්කරෙයිපත්තු දකුණ කල්පිටිය කොට්ඨාසය තුළ කල්පිටිය ප්‍රාදේශීය සභා කොට්ඨාසය තුළ මුන්ඩාල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ අක්කරෙයිපත්තු උපකාර්යාල ප්‍රදේශය තුළ කඩයමොත්තෙයි 599 ග්‍රාම නිලධාරි කොට්ඨාස තුළ කඩයමොත්තෙයි ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. බාලේන්දිරන් විසින් සාදන ලද 2016.11.18 දිනැති අංක 2016/1/577 සැලැස්මේ නිරූපනය වන මංචාඩි චෝලි හෙවත් සෙන්කාල්කට්ටු වවුන් කානි නමැති ඉඩමේ ලොට් ඒ ලකුණු කළ බෙදා වෙන් කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : එම්. පී. එස්. අබ්දීන්ගේ ඉඩම ද, නැගෙනහිරට : බකීර් හජ්ජියාර්ගේ ඉඩම ද, දකුණට : බකීර් හජ්ජියාර්, ජේ. අයි. පින්තු, ඒ. ඩී. සෙබස්තියන් අප්පුහාමි, එම්. එම්. කසීම් සහ තවත් අයගේ ඉඩම සහ බස්නාහිරට : ශාන්ත අන්තෝනි පාර ද යන මායිම් තුළ අක්කර විස්සරයි රූඩ් දෙකයි පර්චස් දොළහයි දශම නවයක් (අ. 20, රූ. 02, පර්. 12.9) විශාල ගස්, ගොඩනැගිලි, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් ඉඩම පහත විස්තර කරනු ලබන ඉඩමේ නැවත මැනීමක් වේ.

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ සහ පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ සහ අක්කරෙයිපත්තු දකුණ කල්පිටිය කොට්ඨාසය තුළ කල්පිටිය ප්‍රාදේශීය සභා කොට්ඨාසය තුළ මුන්ඩාල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ අක්කරෙයිපත්තු උපකාර්යාල ප්‍රදේශය තුළ කඩයමොයිට්ටෙයි 599 ග්‍රාම නිලධාරි කොට්ඨාස තුළ කඩයමොයිට්ටෙ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඩී. එච්. පෙරේරා විසින් සාදන ලද 2003.10.07 දිනැති අංක 639 සැලැස්මේ නිරූපනය වන මංචාඩි චෝලි හෙවත් සෙන්කාල්කට්ටු වවුන් කානි නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : එම්. පී. එස්. අබ්දීන්ගේ ඉඩම ද, නැගෙනහිරට : බකීර් හජ්ජියාර්ගේ ඉඩම ද, දකුණට : බකීර් හජ්ජියාර්, ජේ. අයි. පින්තු, ඒ. ඩී. සෙබස්තියන් අප්පුහාමි, එම්. එම්. කසීම් සහ තවත් අයගේ ඉඩම සහ බස්නාහිරට : ශාන්ත අන්තෝනි පාර ද යන මායිම් තුළ අක්කර විස්සයි රූඩ් දෙකයි පර්චස් දොළහයි දශම නවයක් (අ. 20, රූ. 02, පර්. 12.9) විශාල ඉඩම.

### දෙවෙනි උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ සහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ සහ මුන්ඩාල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ කල්පිටිය ප්‍රාදේශීය සභා කොට්ඨාසය තුළ කල්පිටිය කඩවත්හි අක්කරෙයිපත්තු දකුණ පුලදිවායල් අංක 601ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පුලදිවායල් ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. බාලේන්දිරන් විසින් සාදන ලද 2007.11.16 දිනැති අංක එස්බී/2007/5/83 සැලැස්මේ නිරූපනය වන මාලිගාවේනවත්ත නමැති ගොඩනැගිලි, ගස්, වගා බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන්කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : ඉහත කී සැලැස්මේ සඳහන් ලොට් ඒ ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ඒ. ජී. එස්. බී. පරාක්‍රම විසින් සාදන ලද අංක 432 සැලැස්මේ සඳහන් ලොට් 02 ද, දකුණට : මුහුදු වෙරළ සිට තෙතපොලට යන ප්‍රාදේශීය සභා පාර ද, බස්නාහිරට : අංක පීපී පු 1454 සැලැස්මේ සඳහන් ලොට් 01 ද යන මායිම් තුළ අක්කර විස්සක් (අ. 20, රූ. 0, පර්. 0) විශාල ඉඩම.

ඉහත සඳහන් ඉඩම පහත විස්තර කරනු ලබන ඉඩමේ නැවත මැනීමක් වේ.

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ සහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ සහ මුන්ඩාල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ කල්පිටිය ප්‍රාදේශීය සභා කොට්ඨාසය තුළ කල්පිටිය කඩවත්හි අක්කරෙයිපත්තු දකුණ පුලදිවායල් අංක 601ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පුලදිවායල් ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ජී. එස්. බී. පරාක්‍රම විසින් සාදන ලද 1981.09.13 දිනැති අංක 432 සැලැස්මේ නිරූපනය වන මාලිගාවේනවත්ත නමැති ගොඩනැගිලි, ගස්, වගා බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 1 ලකුණු කළ ඉඩමේ බෙදා වෙන්කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : එල්. ආර්. සී වෙත පවරා ඇති මාලිගාවේනවත්ත ද, නැගෙනහිරට : මෙම සැලැස්මේ සඳහන් ලොට් 02 ද, දකුණට : ගම් සභා පාර ද, බස්නාහිරට : අංක පීපී පු 1454 සැලැස්මේ සඳහන් ලොට් 01 ද යන මායිම් තුළ අක්කර විස්සක් (අ. 20, රූ. 0, පර්. 0) විශාල ඉඩම.

### තුන්වෙනි උපලේඛනය

යඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලකොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ කම්මල්පත්තුව උප කාර්යාල ප්‍රදේශය තුළ තඹරවිල 480 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ තඹරවිල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු වයි. එම්. ආර්. යාපා විසින් සාදන ලද 2006.09.13 දිනැති අංක 10316 සැලැස්මේ නිරූපනය වන මාරා ගහවත්ත නමැති, ගොඩනැගිලි, ගස්, වගා බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන්කළ ඉඩම් කොටස මායිම්,

උතුරට : ඩබ්ලිව්. විල්සන් පීරිස් ගේ ඉඩම ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු වයි. එම්. ආර්. යාපා විසින් සාදන ලද අංක 10059 සැලැස්මේ සඳහන් ලොට් 01 ද, දකුණට : මීගමුව සිට දංකොටුවට යන ප්‍රධාන පාර ද, බස්නාහිරට : පාර ද යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් තිස් නවයයි දහම හයක් (අ. 0, රූ. 01, පර්. 39.6) විශාල ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැච් මෙය.
නීති ප්‍රධානී.

03 - 853

---

## සෙලාන් බැංකුව පීඑල්සී - බෙලිඅත්ත ශාඛාව 2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය :0650-32495389-101.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 ජනවාරි මස 28 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව්9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එච්. අයි. දිල්රුක්ෂි මෙය විසින් සියල්ල සහතික කරන ලද 2017 ජනවාරි මස 26 දිනැති බැඳුම්කර අංක 1227, , 2017 අගෝස්තු මස 04 දිනැති බැඳුම්කර අංක 1252 සහ 2018 ජනවාරි මස 11 දිනැති බැඳුම්කර අංක 1277 මත අයවිය යුතු මුදල් ගෙවීම, බෙලිඅත්ත පදිංචි කපිල සපුමල් බණ්ඩාර තෙම්නිමුල්ල යන අය බන්ධනදායී වශයෙන් රුපියල් දසකෝටි හතළිස් අට ලක්ෂ හැට තුන් දහස් අටසිය අනූ හතරයි ශත හතළිස් දෙකක (රු. 104,863,894.42) මුළු මුදලක්, පොළිය සමග එකී බැඳුම්කර මත පහත සඳහන් පහසුකම් සම්බන්ධයෙන් 2018 නොවැම්බර් මස 13 වැනි දින වන විට මුල් මුදල සහ පොළිය වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී මුළු මුදල වන රුපියල් දස කෝටි හතළිස් අට ලක්ෂ හැට තුන් දහස් අටසිය අනූහතරයි ශත හතළිස් දෙකක (රු. 104,863,894.42) මුදල 2018 නොවැම්බර් මස 14 වැනි දින සිට, විකිණීමේ දිනය දක්වා කාලයට පහත සඳහන් පරිදි පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ තදනන්තරව ලැබී අති යම්කිසි මුදලක් (ඇත්නම්) එකී මුදල අඩුකර අයකර ගැනීම පිණිස, එකී බැඳුම්කර අංක 1227, 1252 සහ 1277 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන සංශෝධිත පරිදි බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මඟින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

(අ) වාර ණය III පහසුකම සම්බන්ධයෙන් රුපියල් හයකෝටියක (රු. 60,000,000) මුදලක් 2018 නොවැම්බර් මස 14 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වසරකට සියයට දහනවය (19%) බැගින් පොළිය සමග 2018 නොවැම්බර් මස 13 වැනි දින වන විට රුපියල් හය කෝටි හැට හතර ලක්ෂ හැට දහස් විසි දෙකයි ශත දහ අටක (රු. 66,460,022.18) මුදලක්.

(ආ) වාර ණය IV පහසුකම සම්බන්ධයෙන් රුපියල් එක් කෝටි අනූහත් ලක්ෂ අනූ එක් දහස් හයසිය හැට හයයි ශත හැට හතක (රු. 19,791,666.67) මුදලක් 2018 නොවැම්බර් මස 14 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වසරකට සියයට දහනවය (19%) බැගින් පොළිය සමග 2018 නොවැම්බර් මස 13 වැනි දින වන විට රුපියල් දෙකෝටි දහ නව ලක්ෂ විසිපන් දහස් හයසිය පනස් පහයි ශත විසි දෙකක (රු. 21,925,655.22) මුදලක්.

(ඇ) වාර ණය V පහසුකම සම්බන්ධයෙන් රුපියල් එක් කෝටි හතළිස් අට ලක්ෂ හතළිස් තුන් දහස් හත්සිය පනහක (රු. 14,843,750) 2018 නොවැම්බර් මස 14 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වසරකට සියයට දහනවයයි දශම හතයි පහ (19.75%) බැගින් පොළිය සමග 2018 නොවැම්බර් මස 13 වැනි දින වන විට රුපියල් එක්කෝටි හැට හතර ලක්ෂ හැත්තෑ අට දහස් දෙසිය දාහතයි ශත දෙකක (රු. 16,478,217.02) මුදලක්.

### 1 වැනි උපලේඛනය

3. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ කීනිගොඩ කෝරළේ, දෙයාල දහමුන පත්තුවේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ හිරිවඩුන්න ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ අන්දිරිමඩ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ආර්. අබේකෝන් විසින් සාදන ලද 2009.08.06 දිනැති අංක 1470 දරන සැලැස්මේ නිරූපනය වන දොරකුඹුරේලන්ද කහටගහමුල්ලේ හේන, දෙමංහන්දිය, හන්කුඹලන්ගහමුල්ලේහේන, මාදංගහමුල්ල ආරච්චිගේ හේන, ඔවටල හෙවත් තුඩුවහේන, දොරකුඹුරේලන්ද හේන, අඹගහමුල්ලේ හේන, දොරලන්දේ අඹගහමුල්ලේ හේන, මිරිස්වැල්ගොල්ලේ කෝන්ගහමුල්ලේහේන, මූනමල්ගහවත්ත,

ලිඳපල්කඩ මඩිත්ත හෙවත් ලිඳපල්කඩවත්ත, කංකුඹලත්ගහහේන, කැටකාලාගහමුල හෙවත් කහටගහමුල්ලේහේන දූන් බංගලාවත්ත යනුවෙන් එක් දේපළක් ලෙස හඳුන්වනු ලබන ඉඩමේ කොටසක් වන ලොට් 1ඒ ලකුණු කළ, සම්පූර්ණ බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමට මායිම්, ඊසාණට : මා ඔයට වෙන්කළ ඉඩම, ගිණිකොණට : ලොට් 01බී සහ නිරිතට : දිවුල්ගහමුලවත්ත, දොරකුඹුර සහ පාර ද යන මායිම් තුළ අක්කර දෙකයි රූඩ් දෙකයි පර්චස් විසිහයක් (අ. 02, රූ. 02, පර්. 26) හෙක්ටයාර් 1.0774කට සමාන ඉඩම.

4. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ කීනිගොඩ කෝරළේ, දෙයාල දහමුන පත්තුවේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ හිරිවඩුන්න ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ අන්දිරිමඩ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ආර්. අබේකෝන් විසින් සාදන ලද 2010.08.17 දිනැති අංක 2432 දරන සැලැස්මේ නිරූපනය වන දොරකුඹුරේලන්දේ වත්ත නමැති ඉඩමේ ලොට් 2 (අඩි 12ක මාර්ග ප්‍රවේශය) උඩින් සහ දිගේ මාර්ග අයිතීන් සහ සියලු පොදු අයිතිවාසිකම් සමග ඉඩමට මායිම්, උතුරට : අංක 2432 සැලැස්මේ සඳහන් ලොට් 01 ද, නැගෙනහිරට : උපාලි සේනානායක මහතා විසින් හිමිකම් කියනු ලබන දොරකුඹුර ද, දකුණට : පාර සහ එස්. නිශාන්ත සමරවීර විසින් හිමිකම් කියනු ලබන දොරකුඹුර සහ බස්නාහිරට : පාර (පොදු) ද යන මායිම් තුළ පර්චස් විසිහයයි දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 26.75) හෙක්ටයාර් 0.0676කට සමාන ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැච් මෙය.
නීති ප්‍රධානී.

03 - 854

---

**සෙලාන් බැංකුව පීඑල්සී - කළුතර ශාඛාව**
**2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව.

ගිණුම් අංකය : 0360 12823077 001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019.01.28 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව්9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එච්. කේ. ගීතිකා පෙරේරා මෙය සහතික කරන ලද 2017.12.27 දිනැති ප්‍රාථමික උකස් බැඳුම්කර අංක 1750 මත අයවිය යුතු මුදල් ගෙවීම, දොඩන්ගොඩ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සහ ලියාපදිංචි අංක පීවී 121276 දරන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන සෙන්හිරු මයික්‍රෝ ක්‍රෙඩිට් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් සහ දොඩන්ගොඩ පදිංචි වගවත් ආරච්චිගේ අසංක ප්‍රේමචන්ද්‍ර යන අය බන්ධනදායී වශයෙන් රුපියල් දෙකෝටි පනස් පන් ලක්ෂයක (රු. 25,500,000) මුදලක්, එකී බැඳුම්කරය මත කාලීන ණය පහසුකම II සම්බන්ධයෙන් 2018 දෙසැම්බර් මස 11 වැනි දින සිට වසරකට සියයට විස්ස (20%) බැගින් පොළිය සමග රුපියල් දෙකෝටි හැට තුන් ලක්ෂ පනස් එක් දහස් පන්සිය හයයි ශත අසූපහක (රු. 26,351,506.85) මුදලක් 2018 දෙසැම්බර් මස 10 වැනි දින වන විට මුල් මුදල සහ පොළිය වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී මුළු මුදල වන රුපියල් දෙකෝටි හැට තුන් ලක්ෂ පනස් එක් දහස් පන්සිය හයයි ශත අසූපහක (රු. 26,351,506.85) මුදලක් 2018 දෙසැම්බර් මස 11 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට පෙරකී පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එකී මුදල අඩුකර අයකර ගැනීම පිණිස, එකී ප්‍රාථමික උකස් බැඳුම්කර අංක 1750 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තා වූ මෙහි පහත සඳහන් උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන (සංශෝධිත පරිදි) බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

01. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුන, පානදුර තල්පිටිදෙබැද්ද, පානදුර නගර සභා සීමාව තුළ පානදුර ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසය තුළ වෑකඩ උතුර අංක 687සී ග්‍රාම නිලධාරී කොට්ඨාස තුළ වෑකඩ වඩාත් නිවැරදිව වලපොල පට්ටිය පිහිටි (බ./මි. එච්. පී. ඒ. ජයවික්‍රම විසින් සාදන ලද 2008.10.11 දිනැති අංක 11685 සැලැස්මේ නිරූපනය වන ලොට් එක්ස් හි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) බ./මි. එච්. පී. ඒ. ජයවික්‍රම විසින් සාදන ලද 2008.11.24 දිනැති අංක 11774 සැලැස්මේ සඳහන් අඹගහවත්ත සහ කෝන්ගහවත්ත, කැබැල්ලගහවත්ත සහ කෝන්ගහවත්ත පාවුල ඕවිට නමැති සම්පූර්ණ බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 1ට මායිම්, උතුරට : කරුණානායකගේ දේපළ ද, නැගෙනහිරට : පොන්සේකා පාර වරිපනම් අංක 14/3 දරන පරිශ්‍රය ද, දකුණට : ලොට් 2ඒ සහ 2බී (අඩි 10ක් පළල පාර) ද, බස්නාහිරට : පොන්සේකා පාර වරිපනම් අංක 39/3බී දරන පරිශ්‍රය ද යන මායිම් තුළ පර්චස් පහළොවයි දශම පහයි පහක් (අ. 0, රූ. 0, පර්. 15.15) නොහොත් හෙක්ටයාර 0.03933ක් විශාල ඉඩම.

02. පෙරකී වැකඩ වඩාත් නිවැරදිව වලපොල පට්ටිය පිහිටි (බ./මි. එච්. පී. ඒ. ජයවික්‍රම විසින් සාදන ලද 2008.10.11 දිනැති අංක 11685 සැලැස්මේ නිරූපනය වන ලොට් එක්ස් හි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) බ./මි. එච්. පී. ඒ. ජයවික්‍රම විසින් සාදන ලද 2008.11.24 දිනැති අංක 11774 සැලැස්මේ සඳහන් අඹගහවත්ත සහ කෝන්ගහවත්ත, කැබැල්ලගහවත්ත සහ කෝන්ගහවත්ත පාවුල ඕවිට නමැති සම්පූර්ණ බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 2ඒ ට මායිම්, උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : පොන්සේකා පාර වරිපනම් අංක 47/3 දරන පරිශ්‍රය ද, දකුණට : පොන්සේකා පාර වරිපනම් අංක 39/6 දරන පරිශ්‍රය ද, බස්නාහිරට : ලොට් 2බී (අඩි 10ක් පළල පාර) ද යන මායිම් තුළ පර්චස් දොළහයි දශම හතයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 12.70) නොහොත් හෙක්ටයාර 0.03212ක් විශාල ඉඩම.

**මාර්ග අයිතිය සමග**

පෙරකී වලපොල පිහිටි (බ./මි. එච්. පී. ඒ. ජයවික්‍රම විසින් සාදන ලද 2008.10.11 දිනැති අංක 11685 සැලැස්මේ නිරූපනය වන ලොට් එක්ස් හි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) බ./මි. එච්. පී. ඒ. ජයවික්‍රම විසින් සාදන ලද 2008.11.24 දිනැති අංක 11774 සැලැස්මේ සඳහන් අඹගහවත්ත සහ කෝන්ගහවත්ත, කැබැල්ලගහවත්ත සහ කෝන්ගහවත්ත පාවුල ඕවිට නමැති ඉඩමේ ලොට් 2බී ලකුණු කළ බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : ලොට් 2ඒ ද, දකුණට : පොන්සේකා පාර වරිපනම් අංක 39/6 දරන පරිශ්‍රය ද, බස්නාහිරට : අංක 9247 සැලැස්මේ සඳහන් ලොට් 3 (අඩි 11-12ක් පළල පාර) සහ පොන්සේකා පාර වරිපනම් අංක 35 දරන පරිශ්‍රය ද යන මායිම් තුළ පර්චස් දෙකක් (අ. 0, රූ. 0, පර්. 2)ක් නොහොත් හෙක්ටයාර 0.00506ක් විශාල ඉඩම.

පෙර කී ඉඩම් 03 වැඩිදුරටත් පහත සවිස්තරව විස්තර කරනු ලබන ඉඩමේ අතුරු බෙදීම් වේ.

පෙරකී වැකඩ වඩාත් නිවැරදිව වලපොල පට්ටිය පිහිටි (බ./මි. එච්. පී. ඒ. ජයවික්‍රම විසින් සාදන ලද අංක 1635 සැලැස්මේ වඩාත් නිවැරදිව 2008.10.11 දිනැති අංක 11685 සැලැස්මේ පරිදි අඹගහවත්ත සහ කෝන්ගහවත්ත, කැබැල්ලගහවත්ත සහ කෝන්ගහවත්ත පාවුල ඕවිට නමැති සම්පූර්ණ බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් එක්ස් ට මායිම්, උතුරට : කරුණානායකගේ දේපළ ද, නැගෙනහිරට : පොන්සේකා පාර වරිපනම් අංක 47/3 දරන පරිශ්‍රය ද, දකුණට : පොන්සේකා පාර වරිපනම් අංක 39/6 දරන පරිශ්‍රය ද, බස්නාහිරට : අංක 9247 දරන සැලැස්මේ සඳහන් ලොට් 3 (අඩි 11-12ක් පළල පාර) සහ පොන්සේකා පාර වරිපනම් අංක 39/3බී යන මායිම් තුළ පර්චස් තිහයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 30.25) නොහොත් හෙක්ටයාර 0.07651ක් විශාල ඉඩම.

අංක 11774 සැලැස්මේ දැක්වෙන පරිදි අංක 9247 සැලැස්මේ සඳහන් ලොට් 3 උඩින් මාර්ග අයිතිය සමග.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැච් මිය.
නීති ප්‍රධානී.

03 - 856